# Lesson Plan for Multi Level Teaching

## (Sinhala Medium)

## Grade 1 - 4

Provincial Department of Education
Central Province
Kandy

01 දිනය - පළමු වාරය :7 වන සතිය 2 දිනය

02 ශ්‍රේණිය - 1

03 විෂය - මව්බස

04 කාලය - මිනිත්තු 60

05 ක්ෂේත්‍රය - R W

06 නිපුණතාවය -

කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි '

ලිවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් ලියයි'

06 ඉගෙනුම් පල - ශබ්ද විභේදන හඳුනාගෙන අකුරු, වචන ,වාක්‍යංශ සහ වැකි උච්චාරණය කරයි'

07 අතුරු ඉගෙනුම් පල - ශබ්ද විභේදන හඳුනාගෙන අකුරු උච්චාරණය කරයි'
" ග "අකුර හඳුනා ගනී '

"ග" අකුර ලියයි'

08 පාඩම - "ග " අකුර හඳුනා ගැනීම
09 ඉගෙනුම් සම්පත් -අකුරු කාඩ්පත්
10 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවළ / කණ්ඩායම්
11 හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්

1 පියවර- ගීතයක් මගින්

ගංගා ආවා
ගස්ලබු දැක්කා
ගල උඩ නැග්ගා
ගස්ලබු කැඩුවා -
"ග" යෙදුණු වචන ඇසුරින් "ග"ඉස්මතුකර පෙන්වීම'

I. කතන්දරයක් මගින්

ඔන්න පුතේ එකමත් එක ගමක ගමරාල කෙනෙක් හිටියා. මේ ගමරාලට ලස්සන දුවක් හිටියා ගගනී කියලා. දවසක් ගගනී ගඟ ළඟට ගියා. ගඟ ළඟ තිබුණු ලොකු ගස ළඟට වෙලා ගගනි ගඟ දිහා ආශාවෙන් බලාගෙන හිටියා. කියමින් මෙහි යෙදෙන පින්තූර හා එම වචන අලවා කියවීම.

II. ක්‍රීඩාවක් මගින්

සිසුන් එළිමහනට රැගෙන ගොස් මිදුලේ රවුමක් ඇඳ අකුරු කිහිපයක් ලියා රවුම මැද තබා දුව ගොස් එම අකුරු අතරින් " ග "අකුර තෝරා පුවරුවේ රැඳවීම.


III. ග අකුර පස් රූලේ ලියා පෙන්වීම

**භාවිත ක්‍රියාකාරකම්**

I.**කාඩ්පත් අතරින් ග අකුර තේරීම**

II.**ග යෙදෙන පින්තූර තෝරා කියවීම**







III.**ග යෙදෙන පින්තූර තෝරා ඇලවීම'**

**ඇගයීම හා තක්සේරු ක්‍රියාකාරකම්**

I. **රවුම තුළ ඇති අකුරු වලින් ග අකුර රවුම් කිරීම.**




II. **ග අකුරු යෙදෙන පින්තූර යා කිරීම.**

**ග**






III. **"ග " අකුර පස්රෑලේ ලිවීම'**

13**ඉදිරිපෝෂණය හා ප්‍රතිකාර්ය -ගතික කණ්ඩායම්**

**තනිව ඉගෙන ගන්නා කණ්ඩායම**

A **කණ්ඩායම - ග යෙදෙන පින්තූර බලා කියවීම.**

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

B **කණ්ඩායම - ග මුලට යෙදෙන පින්තූර පාට කිරීම.**






**ගුරුවරයාගේ මදක් සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

C **කණ්ඩායම - කඩඉරි උඩ ග අකුර ලිවීම.**

**ගුරුවරයාගේ මදක් සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

D **කණ්ඩායම - ග මුලට යෙදෙන පින්තූර ඇඳ පාට කිරීම හා හිඩැස්පත් මත " ග" අකුර ලිවීම.**

**සාරාංශය -**

**" ග" අකුර පස්රුළේ ලියා ප්‍රදර්ශනය කර අද දූවලා පුතාලා ඉගෙන ගත්තේ මේ " ග" අකුරයි පවසා " ග" අකුරෙන් පටන් ගන්නා ඉගෙන ගත් වචන කීපයක් සිසුන්ගෙන් විමසමින් ගුරුතුමි ද ශබ්ද නඟා කියවමින් පාඩම සාරාංශ කිරීම.**

01 දිනය - දෙවන වාරය 3 සතිය 2 දිනයි

02 ශ්‍රේණිය- 1

03 විෂයය- මව්බස

04 කාලය- මිනිත්තු 60

05 ක්ෂේත්‍රය- R W

06 නිපුණතාව - R1 සම්මත කියවීම් යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි

W1 සම්මත ක්‍රමයට ලියයි

07 ඉගෙනුම් පල අකුරු වචන වල විවිධතා හඳුනාගෙන නිවැරදිව කියවයි ලියයි.

* ඇලපිල්ල හඳුනා ගනී (අ ශබ්දය සමඟ)ෙදවන

* අකුරු වලට ඇලපිල්ල යොදා කියවයි ලියයි.

* ඇලපිල්ල යෙදූ වචන කියවයි ලියයි.

08 පාඩම ඇලපිල්ල හඳුනාගෙන වචන කියවීම ලිවීම

09 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවල කණ්ඩායම්

10 හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්

පියවර 1 ගීතයක් මගින්

කෝප්පයට කොක්ක වගේ

අකුරට ළංවෙන

ඇලපිල්ලයි දැගනු මා


ආ හඬ නං වන

කවිය ගායනා කරමින් ඇලපිල්ල ආ ශබ්දය යෙදෙන බව හඳුන්වා දෙමින් අකුරු වලට ඇලපිල්ල යොදා කියවීම හා ලිවීම


පියවර 2 මාලා මාලයක් දමාගෙන සායත් ඇඳගෙන සාලයට ගිහින්. නට නටා හිටියා නැටුම දැකපු මාලාගේ මල්ලි නළාව පිඹ ඇගේ නැටුමට සහාය දැක්වුවා. පනාව ගෙන කොණ්ඩය පීරමින් සිටි අම්මා එතනට ඇවිත් අප්පුඩි ගැසුවා. මාලාටත් මල්ලීටත් හරි සතුටුයි.

ඉහත කතන්දරේ කියමින් ඇලපිල්ල යෙදූ වචන මතුකර දක්වමින් කියවීම


පියවර 3 අඳින ලද රූප හුණු පුවරුවේ රඳවා රූපවලට අදාළ වචන ලියා ආදර්ශනය කිරීම




මාලය



පනාව



තාරාව



නලාව

භාවිත ක්‍රියාකාරකම්

පියවර 1  දෙන ලද කාඩ්පත් වලින් ඇලපිල්ල සහිත අකුරු තෝරා වෙන් කිරීම

පියවර 2  රූපයට ගැලපෙන වචනය තෝරා රූපයට යටින් තබන්න

මාලය    නලාව    පාර    නාසය


පියවර 3 මේ හිස්තැනට සුදුසු අකුරු කාඩ්පතේ ලියා කියවන්න




---------------- ර



-------------------වා



වල----------------



-----------------දය

ඇගයීම හා තක්සේරුව


පියවර 1 දෙන ලද අකුරුවලට ඇලපිල්ල  ලියා කියවන්න

# ග හ ය ස ප න ත ක ට ව ච ඩ

පියවර 2 රූපයට ගැළපෙන වචනය සොයා යා කරන්න්



හාවා



පාලම



නයා

පියවර 3 දෙන ලද රවුමෙන් අකුරු තෝරා මුලට ඇලපිල්ල යෙදෙන වචන පහක් සාදන්න.

මා  යා

නා  ස  ල

ත  ග  ම

පා  සා

ප්‍රතිකාර්ය හා ඉදිරි පෝෂණය

1 තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

පහත වචන ගලපා ලියන්න

1 ල/මා/ය

2 ස/පා/ල

3 රා/තා/වා

4 ල/තා/ය

5 ද/නා/ය

2 යහළුවන්ගේ සහය ඇති ඉගෙන ගන්නා කණ්ඩායම

හිස්තැන් පුරවන්න

1 ------ලය (ම/මා) 2 න----ව (ළා/ලා)

3 ---------රාවා (තා/ත) 4 නය -----(න/නා)

5---------ලමා (පා/ප)

3 ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

ගුරුවරයා කියන අකුරු දෙකේ වචන අකුරු දෙකේ වචන ගලපා තබා කියවීම

නාද / තාල / පාර / යාල / සාද

4 ගුරුවරයාගේ සම්පූර්ණ සහය අවශ්‍ය කණ්ඩායම

අකුරු කාඩ් වලට ඇලපිල්ල තබමින් ගුරුවරයා විසින් කියවීම

සිසුන්ට අකුරු කාඩ් වලට ඇලපිල්ල තබා කියවීමට දීම

සාරාංශය - ඇලපිල්ල සහිත අකුරු හඳුනා ගැනීම හා වචන කියවීම

01 දිනය - පළමුවාරය (5 සතිය 1 දිනය)

02 ශ්‍රේණිය- 2

03 විෂයය- ගණිතය

04 කාලය- මිනිත්තු 60

05 ඒකකය- රූප /සංඛ්‍යා රටා ගොඩනැගීම

06 නිපුණතාව - රූප සංඛ්‍යා රටා ගොඩනගයි.

07 ඉගෙනුම් පල- 1 රූප රටාවක ඊළඟට ආ යුතු රූප හඳුනාගෙන රටාව ඉදිරියට ගොඩනගයි

. 11 රටාව හඳුනාගෙන ඊළඟට එන රූපය තෝරයි.

08 පාඩම - රූප රටා

09 වාංමාලාව - රූප රටාව

10 ඉගෙනුම් සම්පත්- රූප රටා. රතු නිල් පාට සකසන ලද මාල A4 වලින් හැඩතල මල් කොළ සමනළ රූප කාඩ්

11 ක්‍රමවේදය - කණ්ඩායම් හා කේවල ක්‍රමය

12 මනෝමය ගණිතය- සුදුසු ගැටළු 2 සදිරිපත් කරන්න

13 හඳුන්වාදී ක්‍රියාකාරකම්

පියවර 1 පහත කවිය ගායනා කරමින් මාල කීපයක් ගෙන ඒවා රටාවකට දරුවන් කීපදෙනෙකුට දමා රටාව කීම
මාල මාල මාල ගන්නවාද මාල

පාට පාට මාල ගන්නේ නැද්ද මාල

හරි ලස්සන මාල හරි ලාබයි මාල

කවුද ගන්නේ මාල

පියවර 2

සිසුන් එළියට රැගෙන ගොස් අපි දැන් පුංචි සෙල්ලමක් කරමු පවසා ටින් කිහිපයක් හා හැඩතල කිහිපයක් ඇති ඇතින් තබා කංකම් බුරු ක්‍රීඩාව මගින් දුවගෙන ගොස් ඒවා අහුලාගෙන ටින් වල ගැසීම පසුව ඒවා රටාවකට තබා රටාව කියවීම


පියවර 3

අම්මා පොළට ගිහින් පලතුරු ටිකක් ගෙනාවා. ඒවා මොනවාද කියා අපි බලමු යයි පුංචි කතාවක් කියමින් පළතුරු රටාවක් කළු ලෑල්ලේ අලවමින් රටාව හඳුන්වාදීම

15 භාවිත ක්‍රියාකාරකම්-

පියවර 1. මල් හා සමනළ රූප කපා ලබාදී කණ්ඩායම එකතු වී ඒවා රටාවකට ලබාදී ඇති ටින් පේළියේ ගැසීමට දී එම හා රටාව කියවීම


පියවර 2 පහත රටාව බලා ඊළඟට එන රූපය තෝරා හිස්තැන මත තබා රටාව කියවීමටදීම




පියවර 3 පාට A4 වලින් කපන ලද මල් පාට දෙකක හා කළු ඩෝවින් කොළයක මාලයක් ඇඳ දී එම මල් රටාවකට අලවා මාලය නිර්මාණය කර රටාව කියවීම

16 තක්සේරුව හා ඇගයීම

පියවර 1 . රටාව බලා ඊළඟට එන රූපයේ රවුම් කිරීමට දීම



පියවර 2  රටාව බලා ඊළඟට එන රූපය යා කිරීම



පියවර 3  රටාව බලා ඊළඟට එන රූපය ඇඳීමටදීම



17 ප්‍රතිකාරය හා ඉදිරි පෝෂණය

1 තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

හැඩතල අඳින ලද පින්තූර කොළයක් ලබා දී රචා පාට කර ඒ වටා කපා අලවා රටා ගොඩනගන්න

11 යහලුවන්ගේ සහය ඇතුව ඉගෙන ගන්නා කණ්ඩායම

දෙනලද රටාව පොතේ ඇද පාට කරන්න

111 ගුරුවරයාගේ සහාය මදක් අවශ්‍ය කණ්ඩායම

රටාවක් ලබාදී ඊළගට එන රූපය අඳින්න

1v ගුරුවරයාගේ සහය වැඩිවශයෙන් අවශ්‍ය කණ්ඩායම

ගුරුතුමිය ද්‍රව්‍ය රටාවක් සිසුන් සමග සකස් කිරීම නැවත වෙනත් රූප ලබා දෙමින් රටා ගොඩ නැගීම

17 සාරාංශය -රටා දෙකක් සිසුන් සමග ගොඩනැගීම

**දිනය -** පළමුවාරය 8 වන සතිය 4 දිනය

**විෂය - ගණිතය**

**ශ්‍රේණිය - 1**

**පාඩම - 1 සිට 3 තෙක් සංඛ්‍යානාම හඳුනා ගැනීම.**

**නිපුණතාවය - 1 සිට 3 තෙක් සංඛ්‍යානාම හඳුනාගෙන භාවිත කරයි**

**ඉගෙනුම්** පල -

- **1 සිට 3 තෙක් සංඛ්‍යා නම් කියයි**
- **1 සිට 3 තෙක් සංඛ්‍යා රූප ඇසුරින් නිරූපණය කරයි**

හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්

I. **ගීතයක් මගින්**

**මල් වට්ටිය අරගනිමු**
**වත්ත පහළ දිව යමු**
**එකයි දෙකයි තුනයි කියා**
**මල් වට්ටිය පුරවමු**

II. **ක්‍රීඩාවක් මගින්**

**එළිමහන්නට රැගෙන ගොස් කං කං බූරු ක්‍රීඩාව ඇසුරෙන්** 1,2,3 **හඳුන්වාදීම.**

III. **කතන්දරයක් මගින්**

**ඔන්න පුතේ එක්කමත් එක්ක කාලෙක හිටියා රෝසි කියලා ආච්චි කෙනෙක්. එයා ගමේ පුංචි ගෑණු ළමයින්ට ගවුම් මහල දුන්නා. මේ ගමේ හිටිය පුංචි මලීටත් ඕන උනා. ඉතින් රෝසි ආච්ලා ගෙදරට ගියා. ආච්චි නම් ගෙදර නෑ. මහපු ගවුම් වගයක් වැලේ තිබුණා. මේ බලන්න යැයි කියමින් ගණන් කිරීම.**

**භාවිත ක්‍රියාකාරකම්**


I. **කණ්ඩායම් වලට ගල් කැට ලබා දී ගණන් කරමින් යෝගට් කෝප්ප දැමීම**

II. **මල් ලබාදී** 1,2,3 **ගණන් කරමින් පැමිණීම.**

III. **කපන ලද** A4 **වලින් දොඩම් ගෙඩි ලබා දී ගණන් කරමින් ඇලවීම.**


**තක්සේරු ක්‍රියාකාරකම්**

I. **ලබා දෙන පැවරුම් පතේ රූප 3ක් පාට කිරීම**



II. **ලබා දෙන පැවරුම් පතේ  ලකුණ යොදමින්** 1,2,3 **ගණන් කිරීම.**

III.



IV. **තමන් කැමති රූප** 1,2,3 **ලෙස ඇඳීම.**

**ප්‍රතිකාරය හා ඉදිරි පෝෂණය**

තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

A . **කණ්ඩායම -** සතුන්ගේ රූප 3 ක් ඇද පාටකර 1,2,3 ලෙස **ගණන් කිරීම**

යහළුවන්ගේ සහය ඇතුව ඉගෙනගන්නා කන්ඩායම

B . **කණ්ඩායම -** ද්‍රව්‍ය 3 ක් ලබාදී 1 2 3 ලෙස ගණන් කරමින් අංක කාඩ්පත් පිළිවෙලට තැබීම

ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

C . **කණ්ඩායම -** රූප එකක් දෙකක් හා තුනක් ඇති කාඩ්පත් කලවමට ලබා දී ගණන්කර වෙන්කිරීමට දීම

ගුරුවරයාගේ සහය වැඩිවශයෙන් අවශ්‍ය කණ්ඩායම

D . **කණ්ඩායම -** ද්‍රව්‍ය කිහිපයක් ලබාගෙන ගුරුවරයා විසින් නැවත 1 2 3 ලෙස හදුන්වා දී නැවත ද්‍රව්‍ය ගොඩවල් වලට දරුවන් සමග වෙන් කිරීම.

- **දිනය** -: දෙවන වාරය 9 වන සතිය 1 දිනය
- **විෂය** -: ගණිතය
- **ශ්‍රේණිය** -: 1 ශ්‍රේණිය
- ඒකකය - හැඩතල හඳුනාගැනීම හා රටා ගොඩනැගීම
- **නිපුණතාව** -: **. ජ්‍යාමිතික හැඩතල භාවිතයෙන් නිර්මාණ කරයි.** සරල රටා ගොඩනගයි.

- **ඉගෙනුම් පල** -: **ජ්‍යාමිතික හැඩතල භාවිතයෙන් නිර්මාණ ගොඩ නගයි.**
  - හැඩතල හඳුනා ගනියි.
  - හැඩතලවල නම් කියයි.
  - හැඩතල අඳියි
  - හැඩතල ඇසුරින් නිර්මාණ ගොඩ නගයි
- **පාඩම** -: හැඩතල හඳුනාගැනීම.

- **ඉගෙනුම් සම්පත්** -: හැඩතලවලින් සැකසූ නිර්මාණ, හිඩැස්පත්, $A_4$ කොළ, ගම්, කතුරු

- **කාලය** -: මිනිත්තු 60

- **හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්** -:

1) තේරවිලි මගින්

   **උදා-: මට පාද තුනක් තියෙනවා . ඔයාලා කන්න ආස වීසුත් මගේ හැඩෙන් තියෙනවා.**

   මේ ආකාරයෙන්ම ඉතිරි හැඩතල හතර ම හඳුන්වා දීම.


   කතන්දරයක් මගින්

2) ගුරුතුමිය හැඩතල අඳින ආකාරය කතන්දරයක් ආකාරයට පැහැදිලි කර දීම. '' පුතේ අපේ වත්තේ මල් පාත්ති හැදුවා හැඩතල හැඩයට. ඉතින් මට ඒ මල් පාත්ති හදාගන්න හැඩ අඳින්න මේ වගේ ලොකු හිඩැස් පත් තිබුණා. ඒවා තියලා මම මල් පාත්ති හැදුවා. මෙසේ පවසමින් හිඩැස්පත් තබමින් හැඩතල අඳින අකාරය ආදර්ශනය කර පෙන්වීම.

   හිඩැස්පත් නැතිව රූල භාවිතයෙනුත් අඳින ආකාරය පැහැදිලි කර දීම.

3) රූපයක් මගින්

   හැඩතල ඇසුරින් නිර්මාණ කිරීමට හැකි බව කියා දී එක් නිර්මාණයක් ආදර්ශනය කිරීම. මෙහිදී හැඩ එකට එක නොගෑවෙන සේ නිර්මාණ කළ යුතු බව අවධාරණය කරන්න.



➲ **භාවිත ක්‍රියාකාරකම් -:**

1) සියළු දරුවන් එළිමහනට රැගෙන ගොස් ස්ථාන 4ක හැඩතල 4 ම තබා සංඥාවකට අනුව පවසන හැඩතලය දෙසට දිවීමට යොමු කිරීම. එම ස්ථානයට ගොස් ශබ්ද නගා හැඩතලයේ නම කියා නැවත පැමිණීම.
(කාලය - මි 04 )

2) කණ්ඩායම්වලට හිඩැස් පත් හා $A_4$ කොළ ලබා දී හැඩතල ඇදීමට ලබා දීම. එම හැඩ කපාගැනීමට ලබා දීම. එම හැඩතලවල නම් පැවසීමට සිසුන් යොමු කිරීම.
3) එම කපාගත් හැඩතල ඇසුරින් කණ්ඩායම තුළ නිර්මාණයක් කිරීමට යොමු කිරීම

➲ ඇගයීම හා **තක්සේරු ක්‍රියාකාරකම් -:**

1 පියවර යාකරන්න

කපාගත් හැඩතල (ත්‍රිකෝණය/වෘත්තය/සමචතුරස්‍රය/සෘජුකෝණාස්‍රය)

ලබාදී වෙන් කිරීමට දීම

11 පියවර

සෑම දරුවෙකුටම සුදු කඩදාසියක් හා පාට කොළ වලින් කපාගත් හැඩතල ලබා දී හැඩතල ඇසුරින් නිර්මාණයක් කිරීමට අවස්තාව ලබා දීම. ඒ ඒ හැඩතල පෙන්වූ විට හැඩතලයේ නම ප්‍රකාශ කිරීමට අවස්තාව ලබා දීම

➲ **ප්‍රතිකාර්ය හා ඉදිරිපෝෂණ ක්‍රියාකාරකම්**

තනිව ඉගෙනගන්නා කණ්ඩායම

**A කණ්ඩායම -:** හිදැස්පත් භාවිතයෙන් හැඩතල ඇඳ කපා විවිධ නිර්මාණ කිරීමට දීම.

යහළුවන්ගේ සහය ඇතුව ඉගෙනගන්නා කණ්ඩයෙම

**B කණ්ඩායම -:** එක් හැඩතල වර්ගයකින් පමණක් නිර්මාණ කිරීමට ලබා දීම.

ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

**C කණ්ඩායම -:** හැඩතල කපා දී එම හැඩතල ඇසුරින් නිර්මාණ කිරීමට දීම. ගුරුතුමිය දෙන ලද නිර්මාණය දෙස බලා නිර්මාණය ගොඩ නැගීමට දීම.

ගුරුවරයාගේ සහය වැඩිපුර අවශ්‍ය කණ්ඩායම

**D කණ්ඩායම-:** ගුරුතුමිය දරුවන් අසළට ගොස් එක් එක් හැඩතලය පෙන්වමින් නැවත නම ඇසීම හිඩැස්පත් ඇසුරින් හැඩතල අදින ආකාරය කියා දීම. හැඩතල කට්ටල ඇසුරින් නිර්මාණ කිරීම.

1 දිනය - පළමු වාරය 5 වන සතිය 1 දිනය

2 ශ්‍රේණිය - 2 ශ්‍රේණිය

3 විෂය - ගණිතය

4 කාලය - මිනිත්තු 45

5 නිපුණතාවය - රූප / සංඛ්‍යා රටා ගොඩනගයි'

6 ඉගෙනුම් පල - රටාවක ඊළඟට ආයුතු රූපය හඳුනාගෙන රටාව ඉදිරියට ගොඩනගයි'

7 අතුරු ඉගෙනුම් පල -

- ★ රූප රටාව හඳුනා ගනියි'
- ★ රූප රටාව කියවයි'
- ★ රූප රටාවේ ඊළඟට එන රූපය තෝරයි'
- ★ රූප මගින් රටා ගොඩනගයි'

8 පාඩම - රූප රටා ගොඩනැගීම'

9 ඉ. සම්පත් - ලී වල ගැසු පින්තූර, වැලි පිරවූ ටින්, ගම්, පින්තූර, ඩිමයි කොළ

10 හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්

ගීතයක් මගින්

1* පලතුරු වර්ග දෙකක් යොදා ගනිමින් (අන්නාසි ඇපල්) පහත කවිය ගායනා කරමින් වැලි පිරවූ ටින් වල පලතුරු රටාවකට ගැසීම.

පලතුරු ගොඩයි ගොඩයි

වට්ටි අම්මා මමයි මමයි

රස ගුණපිරි හොඳ පලතුරු

අරගෙන ආවා''''' //

2* කතන්දරයක් මගින්

අපේ අත්තම්මා හැම සෙනසුරාදාම බෝධි පූජාවක් තියන්න පන්සල් යනවා. ඒ යනකොට එයා තෙල්, මල්, පහන්තිර , හඳුන්කූරු..... ආදිය අරන් යනවා. තව විශේෂ දෙයක් අත්තම්මා අරන් යනවා. ඒ තමයි මල් මාලයක් ඒක පාට දෙකක මල් වර්ග දෙකක් යොදාගෙන අපේ අත්තම්මා ලස්සනට හදනවා මල් මාලය හදන ආකාරය මම ඔයාලට දැන් පෙන්වන්නම්කෝ මුලින්ම අත්තම්මා සුදු මලක් ( කළු ලෑල්ලේ මල් මාලය අලවමින් කතාව කියනවා ) ඊට පස්සේ කහ මලක් ආයෙමත් සුදු මලක් ඊට පස්සේ කහ මලක් ( මෙලෙස මල් මාලය අලවා රටාව කියවයි ) අපේ අත්තම්මා හැදූ මල් මාලේ ලස්සනයි නේද? අත්තම්මා මේ මල් මාලේ බෝධීන් වහන්සේට පළඳනවා.

3* ක්‍රීඩාවක් මගින්

මල් හා සමනලුන්ගේ රූප ඉදිරියෙන් විසුරුවා හැර සිසුන්ට ක්‍රීඩාවක් ආකාරයෙන් දුවගෙන ගොස් ඒවා ඇහිඳගෙන ආපසු ඔවුන් මල සමනලයා මල සමනලයා ලෙස සිටුවා රටාවට කියවයි.

**11' භාවිත ක්‍රියාකාරකම්**

1 **පියවර**

**කෝටුවල ගසන ලද මල් හා කොළ ලබා දී ඒවා රටාවකට ටින්වල ගසා රටාව කියවීම'**

2 **පියවර**

**හැඩතලවල රූප ලබා දී රටා දෙකක් ගොඩනගා රටාව කියවයි'**

3 **පියවර**


**වීදුරු හා කෝප්ප, මල් හා කොළ ලබා දී රටා ඕමයි කොළවල ඇලවීම හා කියවීම'**

**12' ඇගයීම් (තක්සේරු ක්‍රියාකාරකම්)**

I. **රටාවේ ඊළඟට එන රූපය සොයා රවුම් කරමු**



......................



......................



......................


II. **රටාවේ ඊළඟට එන රූපය අඳිමු**



......................



......................



......................

III. **පින්තූරවලින් රටා අලවමු.**

**මල් හා කොළවල පින්තූර ලබා දී රටාවක් ඇලවීම**

**13'** **ප්‍රතිකාරය හා ඉදිරිපෝෂණ ක්‍රියාකාරකම්**


**ගතික කණ්ඩායම් වෙන් කිරීම**

<u>තනිව ඉගෙනගන්නා කණ්ඩායම</u>

A - **සතුන් දෙදෙනකුගේ රූප ලබාදී ඒවා පාට කර කපා රටාවකට ඇලවීම'**

<u>යහළුවන්ගේ සහයෙන් ඉගෙන ගන්නා කණ්ඩායම</u>

B - **රටාවේ ඊළඟට එන රූපය අඳිමු'**



<u>ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම</u>

C - **රටාවේ ඊළඟට එන රූපය තබන්න'**

<u>ගුරුවරයාගේ සහය වැඩිපුර අවශ්‍ය කණ්ඩායම</u>

D - **ගුරුතුමිය අසලට ගොස් සමනලයන් හා මල්වලින් රටා ගොඩනැගීම.**

**සාරාංශය-**

**රූප රටා ගොඩනඟන ආකාර නැවත මතක් කර රටාවක් පෙන්වා ඊළඟ ට එන රූපය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කිරීම'**

01 'දිනය - පළමු වාරය --6 සතිය

02 'ශ්‍රේණිය - 2 ශ්‍රේණිය

03 'විෂය - මව්බස

04 'කාලය - මිනිත්තු 60

05 'ක්ෂේත්‍රය - R W

06 'නිපුණතාව - කියවීමේ යන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි. සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.

07 'ඉගෙනුම් පල - අකුරු එකතු කර වචන සාදයි.

08 'අතුරු ඉගෙනුම් පල - කෙටි ඉස්පිල්ල හඳුනාගනියි'
අකුරු වලට කෙටි ඉස්පිල්ල යොදා කියවයි'
කෙටි ඉස්පිල්ල යෙදෙන වචන කියවා ලියයි'

09 'පාඩම - කෙටි ඉස්පිල්ල හඳුන්වා දීම'

10 'ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවළ/ කණ්ඩායම්

ඉගෙනුම් සම්පත් - වචන කාඩ්පත්/ සාදන ලද ඔටුන්න

11 'හඳුන්වාදීමේ ක්‍රියාකාරකම


**1 පියවර -ගීතයක් මග**


ඩිමයි කොළයක ලියන ලද පහත කවිය ගායනා කරමින් කෙටි ඉස්පිල්ල හඳුන්වා දීම.
කෙටි ඉස්පිල්ල යෙදුණු වචන යටින් ඉරි අඳිමින් කෙටි ඉස්පිල්ලෙන් " ඉ " ශබ්දය මතු කර දැක්වීම.

ටිකිරි ටිකිරි ටිකිරි සිනා
මිහිරි මිහිරි සින්දු කියා
ගිගිරි ගිගිරි තාල තබා
සිඟිති නටයි පාද තියා

2. **පියවර** ---රූප පත්‍රිකා ඇසුරින් "ඉ " ශබ්දය හඳුන්වා දීම'


නිවස


මිදි


කියත


මිටිය

3. **පියවර**

ඩිමයි කොළයක ලියන ලද ඡේදයක් ප්‍රදර්ශනය කර එය කියවමින් "ඉ" ශබ්දය යෙදී ඇති වචන රවුම් කරමින් කෙටි ඉස්පිල්ල මතුකර පෙන්වමින් කෙටි ඉස්පිල්ල හඳුන්වාදීම.

සිඟිති නියර දිගේ නිවිති කඩන්න වෙලට ගියා. වෙල මැද තියෙන සියඹලා ගහේ ගිරව් සියඹලා කනවා. සිඟිති ඒ දිහා බලාගෙන සිටියා. සිඟිති ඉක්මනින් නිවිති කඩාගෙන නිවසට ගියා. ළිඳට ගිය අම්මා වතුර රැගෙන විත් නිවිති උයන්න ගත්තා. අම්මා නිවිති උයලා සිඟිතිට පිඟානට බත් බෙදලා දුන්නා. බත් ටික ඔක්කොම කාපු සිඟිතිට අම්මා මිදි ගෙඩි ටිකකුත් කන්න දුන්නා. සිඟිතිට හරිම සතුටුයි.


12 ' භාවිත ක්‍රියාකාරකම්

පියවර 1

පිල්ලම් රහිත අකුරු කාඩ් කට්ටලයක් කණ්ඩායම්වලට ලබාදී අහඹු ලෙස කාඩ් පතක් ගැනීමට උපදෙස් දීම. ලැබුණු අකුරට කෙටි ඉස්පිල්ල යොදා එක් එක් අකුර කියවීම.


**පියවර 2**

පහත ආකාරයේ අකුරු රවුමක් සෑම කණ්ඩායමකටම ලබා දී එහි ඇති අකුරු යොදාගෙන වචන සෑදීමට යොමු කිරීම. පසුව සාදන ලද වචන කණ්ඩායමේ සියලු දෙනාටම එක් වී ශබ්ද නගා කියවීම. වැඩිම වචන ගණනක් සෑදූ කණ්ඩායම අගය කිරීම.




II. පහත රූප ලබා දී රූපවලට අදාළ අකුර ද ලබා දෙන්න. පසුව රූප ඩිමයි කොළයක අලවා රූපයට යටින් අදාළ වචනය සකසා ඇලවීමට උපදෙස් දීම.






| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පි | හි | ය | ගි | ර | ය | කි | ය | ත | මි | ටි | ය |

13 'ඇගයීම හා තක්සේරුව --ගතික කණ්ඩායම් වෙන් කිරීම

1 ' වචන ලියන ලද පැවරුම් පතක් ලබා දී එහි කෙටි ඉස්පිල්ල යෙදී ඇති වචන රවුම් කිරීම'

2' රූප බලා වචන වල අඩු අකුර පිරවීමට ලබාදීම'
( මිදි , කිරිබත් , කියත ---------- )

3' අසා ලිවීමට වචන ලබාදීම

- මිහිරි
- ගිගිරි
- පිහිටි

14' ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය -- ගතික කණ්ඩායම්

**තනිව ඉගෙන ගන්නා කණ්ඩායම**

A. කතන්දර පොතක් ලබා දී එය කියවා ඉ ශබ්දය යෙදුණු වචන දහයක් රවුම් කිරීම. පසුව එය බලා ලිවීම හා ශබ්ද නගා වචන කියවීම.

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

B. වචන කට්ටලයක් ලබාදී එහි ඉ ශබ්දයේ ඇති ඇති වචන තේරීම ශබ්ද නගා කියවීම

| | | | |
|---|---|---|---|
| කඩය | කිරිල්ලී | මාලය | කැටය |
| පිහිය | කෑරලා | නිවිති | සැමන් |
| පිඟාන | කාලය | වියලි | පිහිටි |

**ගුරුවරයාගේ මදක් සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

C. දෙන ලද අකුරු කට්ටලයේ ඇති අකුරු භාවිත කොට වචන සෑදීම.

| | | | | | |
|---|---|---|---|---|---|
| පි | මි | නි | ස | හි | නි |
| ය | ව | කි | රි | දි | න |

උදාහරණ - පිහිය සිහින කිරි
මිදි නිවස

**ගුරුවරයාගේ සම්පූර්ණ සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

D. අකුරට කෙටි ඉස්පිල්ල යොදා ශබ්ද නගා අකුරු කියවීමට ලබාදීම.

හිසට තොප්පියක් වාගේ
අකුරට සව්වෙන
කෙටි ඉස්පිල්ලයි මා
ඉ හඬ නංවන

කවිය කියවමින් කෙටි ඉස්පිල්ලට අදාළ ශබ්දය හඳුන්වාදීම' "ඉ"ශබ්දයට අදාළ පිල්ලම "ි"
බව හඳුන්වාදීම'අකුරු වලට පිල්ලම යොදා කියවීම'

| | | | | | |
|---|---|---|---|---|---|
| | ි | | | | |
| ප | ස | ක | ර | ත | ච |
| | | | | | |

**සාරාංශය** --කෙටි ඉස්පිල්ල අකුරු වලට යෙදුණු විට " ඉ" ශබ්දය යෙදෙන බවත් අද අපි ඉගෙනගත් වචන වල කෙටි ඉස්පිල්ල යෙදී ඇති බවත් කියා දීම හා එම උගත් වචන නැවත කියවීම'

01. **දිනය** - පලමු වාරය 6 සතිය
02. **ශ්‍රේණිය** - **2 ශ්‍රේණිය**
03. **විෂය** - **මව්බස**
04. **කාලය** - **මිනිත්තු 60**
05. **ක්ෂේත්‍රය** - R W
06. **නිපුණතාවය** -

- **සම්මත නිවැරදි ක්‍රමයට කියවයි. සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.**

**07 ඉගෙනුම් පල** - **අකුරු වචන වල විවිධතා හඳුනාගෙන නිවැරදි වකියවයි' ලියයි'**

**08 අතුරු ඉගෙනුම් පල** - **කෙටි ඇදපිල්ල හඳුනාගනියි'**
**කෙටි අද පෙළ යෙදුණු වචන කියවයි.**
**කෙටි ඇදපිලි යෙදුණු වචන ලියයි.**

**09'පාඩම** - **කෙටි ඇදපිල්ල හඳුනාගැනීම'**

**10 ඉගෙනුම් සම්පත්** - **අකුරු කාඩ්පත්/ වචන කාඩ්පත්/ පින්තූර කාඩ්පත්**
**11 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවළ / කණ්ඩායම්**

**12 හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්**

I. **පියවර -ගීතයක් මගින්**

**වැඩිහිටියන් උදව ඇතිව**
**හඬ හරියට ඉගෙන ගනිමු**
**ඇ ශබ්දය නගමු පුතේ**
**කෙටි ඇදපිලි ලියමු පොතේ**

**පුංචි නැන්දා ආවා**
**කැලේ දෙසට දිව්වා**
**කැන්ද කොළත් කැඩුවා**
**හැලප ටිකක් හැදුවා**

**(ගීතය ගායනා කරමින් අද පිල්ලම් ඉගෙන ගැනීමට යන බව පැවසීම හා නැවත ගීතය ගායනා කිරමින් වර්ණ ගන්වා ඇති වචන භාවිත කරමින් කෙටි ඇදපිල්ල හා ඇ ශබ්දය හඳුන්වා දීම )**

II. **පියවර - කතන්දරයක් මගින්**

**ඔන්න පුතේ එකමත් එක කාලෙක එක ගමක හිටියා ගොවියෙක්. මේ ගොවියගේ කුඹුරට ඇවිත් සත්තු වගා විනාශ කරන නිසා ගොවියා කුඹුරේ ගහක් උඩ <u>පැලක්</u> හදාගන්න හිතුවා. ඉතින් එයා <u>කැලයට</u> ගිහින් <u>කැන්ද</u> ගස් කැපුවා. පැල හදන්න ඉනි කැපුවා. ඊට පස්සේ ගොවියා කපපු ඉනියි, <u>වැල්</u> පොටවල් කිහිපයකුයි අරගෙන හදලා ගැට ගැහුවා. ආයෙත් බිමට බැහැලා කොළ අතු අරගෙන ගහට නැග්ගා. කොළ අතු දාලා පැලේ වහලය හැදුවා. දැන් ගොවියාට හොඳටම මහන්සියි. එයා පැළේ වාඩි වෙලා <u>නැන්දා</u> හදලා දුන්න <u>හැලප</u> කාලා තේ බිව්වා. ( කතන්දරය කීම කතන්දරේ කියන අතරතුර වර්ණ ගන්වා ඇති වචන හා ඒවායේ පින්තූර ප්‍රදර්ශනය කිරීම ඒවා කියවීමෙන් කෙටි ඇද පිල්ල හා "ඇ" ශබ්දය හඳුන්වා දීම)**

III. **ක්‍රීඩාවක් මගින්**

**එළිමහනට ගොස් ක්‍රීඩාවක් මගින් කෙටි ඇදපිල්ල හඳුන්වාදීම. කෙටි ඇදපිල්ල යෙදුණු වචන පත්‍රිකා හයක් එක් ස්ථානයක රඳවා තැබීම. ලබාදෙන විධානයට අනුව දරුවන් දුවගෙන ගොස් එම පත්‍රික ගෙන ගුරුවරයාට ආසන්නයේ ඇති බඳුනේ රැඳවීම. එම වචන පත්‍රිකා භාවිතයෙන් කෙටි ඇදපිල්ල හා "ඇ" ශබ්දය හඳුන්වා දීම.**

වැද්දා | නැව | රැය | වැව | හැන්ද

**13 භාවිත ක්‍රියාකාරකම්**

1 පියවර **ලබා දෙන අකුරු කාඩ්පත් අතරින් කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු තේරීම. එම අකුරු කියවීමට යොමු කිරීම.**

හැ | පැ | පා | තැ | ඩා | දා | බැ | වැ



2 පියවර

**ලබා දෙන අකුරු කාඩ්පත් භාවිතා කර කෙටි ඇදපිල්ල යෙදුණු වචන නිර්මාණය කර පැවරුම්පතේ ඇලවීම.**

| | | |
|---|---|---|
| කැ | ල | ය |
| කැ | ත් | ත |
| හැ | ළ | ප |
| වැ | ස් | ස |
| නැ | න් | දා |

3 පියවර

**පින්තූරයට ගැළපෙන වචනය සොයා ඇලවීමට කණ්ඩායම් වශයෙන් දරුවන් යොමු කිරීම**






කැරට් | නැව | හැන්ද | වැස්ස | පැළය

**14 ' ඇගයීම හා තක්සේරු ක්‍රියාකාරකම්-  ගතික කණ්ඩායම්**

**1' කෙටි ඇදපිළි යෙදුණු අකුරු සොයා රවුම් කිරීම'**

| | | |
|---|---|---|
| නා | පැ | කැ |
| | දැ | වැ |
| සා | මැ | |
| | ඩැ | |
| බ | | හ |

1. **පින්තූරයට ගැළපෙන වචනය සොයා යා කරමු**

| | |
|---|---|
|  | හැන්ද |
|  | කැරට් |
|  | වැස්ස |
|  | නැව |
|  | වැට |

**3 හිස්තැනට ගැළපෙන අකුර තෝරා ලියමු**


1. ................ ළය (නැ/ තැ)
2. ................ ව(නැ/ තැ)
3. ................ස්ස(වැ/ ටැ)
4. ................න්ද(හැ/ ඩැ)
5. ................ටය(කැ/ තැ)
6. ................න්දා(නැ/ ලැ)

**තනිව ඉගෙන ගන්නා කණ්ඩායම**

A - කෙටි ඇදපිල්ල යෙදුණු වචන දහයක් සිංහල කියවීම් පොතෙන් සොයා ලියන්න.

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

B- ගසේ ඇති අකුරු යොදාගෙන කෙටි ඇදපිල්ල යෙදුණු වචනය නිර්මාණය කරන්න.




**ගුරුවරයාගේ මදක් උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

C - අකුරට කෙටි ඇදපිල්ල යෙදුණු විට ලැබෙන අකුරු සොයා යාකරන්න. කියවන්න.

| | |
|---|---|
| ප | මැ |
| ම | පැ |
| ය | සැ |
| ඬ | යැ |
| ස | ඬැ |

**ගුරුවරයාගේ සම්පූර්ණ උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

D- **එක් එක් අකුරට "ඇ" ශබ්දය (කෙටි ඇදපිල්ල) එකතු කර කියවන්න.**

| | |
|---|---|
| ප | ැ |
| ම | ැ |
| ව | ැ |
| ස | ැ |
| ඩ | ැ |

**සාරාංශය - කෙටි ඇදපිල්ල අකුරු වලට යෙදුණු විට "ඇ" ශබ්දය යෙදෙන බවත් අපි අද ඉගෙන ගත්තේ - කෙටි ඇදපිල්ල බවත් කියා දී එම වචන නැවත කියවීම'**

01. **දිනය** - 3 වාරය 10 සතිය 1 දිනය

02. **ශ්‍රේණිය** - **2**

03. **විෂය** - **මව්බස**

04. **කාලය** - **මිනිත්තු 60**

05. **ක්ෂේත්‍රය** - W

06. **නිපුණතාවය** - **සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි'**

07. **ඉගෙනුම් පල** -

- **සම්මත භාෂා ව්‍යවහාරය යොදා භාෂා අභ්‍යාසයේ යෙදෙයි**
- **සම්මත භාෂා ව්‍යවහාරය සොයා ඉදිරිපත් කරයි**

**08' අතුරු ඉගෙනුම් පල** - **විරුද්ධාර්ථ පද හඳුනාගනියි'**

**විරුද්ධාර්ථ පද ලියයි'**

**විරුද්ධාර්ථ පද වාක්‍යවල යොදවා ලියයි'**

**09' පාඩම - විරුද්ධාර්ථ පද**

**10' ඉගෙනුම් සම්පත් - පින්තූර, පැවරුම් පත්**

**11' ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය කණ්ඩායම් / කේවල**

**12' හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්**

**පියවර 1' ගීතයක් මඟින්**

**පහත කවිය ඩිමයි කොළයක ලියා ප්‍රදර්ශනය කිරීම. එය තාලයට ගායනා කිරීම**

**ගස උඩ ලේනා පලතුරු කනවා**

**ගස යට පූසා කිරි ටික බොනවා**

**ලොකුමල් ලස්සන සුවඳ හමනවා**

**පොඩිමල් ලස්සන සුළගේ වැනෙනවා**

**පියවර 2 කතන්දරයක් මඟින්**

**කතන්දරයක් පවසා එමගින් විරුද්ධාර්ථ පද හඳුන්වා දීම ( කතන්දය ප්‍රදර්ශනය කර එහි විරුද්ධ පද යටින් ඉරි ඇඳීම)**

**කතන්දරය - ගස උඩ සිටිනා ලේනා අත්තෙන් අතට පැනලා ඉඳුනු අඹ ගෙඩියක් කන්න පටන් ගත්තා. මේක බලාගෙන ගස යට සිටි පූසෙකුටත් බඩගින්නක් ආවා. ඤාව් ඤාව් කියමින් කෑගහන විට අක්කා පූසාට කිරි ටිකක් හදලා දුන්නා. කිරි බිව් පූසා ගෙදර ඉදිරිපස පාරේ දුවගෙන යනකොට ගහෙන් බැස්ස ලේනා ගෙදර පිටුපස වැට උඩට නැග්ගා. කොළ වැටිලා අපිරිසිදු වූ මිදුල පිරිසිදු කරමින් සිටි අම්මා ලේනාත් පූසාත් දුවන දිහා බලා ගෙන සිටියා.**

**පියවර** 3

**පින්තූරය ප්‍රදර්ශනය කර පින්තූරයට ගැළපෙන විරුද්ධාර්ථ පද සහිත කාඩ්පත් ගැළපෙන ලෙස පින්තූරයේ ඇලවීම.( ඇණුම් 1)**

| | |
|---|---|
| **උඩ යට** | **( පූසා / ලේනා )** |
| **ලොකු පොඩි** | **( මල් )** |
| **ඉදිරිපස පිටුපස** | **( නිවස )** |


පියවර 4

**සරල ක්‍රීඩාවක් මගින් හඳුන්වාදීම**
**ඉහළ පහල, ඉදිරිපස පිටුපස, පිරිසිදු අපිරිසිදු, යනවා එනවා, උඩ යට ප යන විරුද්ධාර්ථ පද අහඹු ලෙස තෝරාගන්නා ලද සිසුන් අට දෙනෙකුට කොඩිවල ලියා ඒවා භාජනයකට ගසා තැබීම. සිසුන්ට දුවගෙන ඇවිත් කොඩියක් ගැනීමට පැවසීම. සිසුන් ගන්නා ලද කොඩි වලට අදාළ විරුද්ධාර්ථ පද ගළපා ගුරුතුමී ප්‍රකාශ කිරීම.**

## 11 භාවිත ක්‍රියාකාරකම්

පියවර I
**සිසුන් කණ්ඩායම් කර සකස් කරගත් පත්‍රිකාවක් සහ කණ්ඩායම්වලට අදාළ කාඩ්පත් පෙට්ටියකට දමා පත්‍රිකාවෙහි හිස්තැන් වලට අදාළව කාඩ්පත් තෝරා තැබීමට දීම'**

| | |
|---|---|
| **උඩ** | ............ |
| **ඉදිරිපස** | ............ |
| **පිරිසිදු** | ............ |
| **ඉහළ** | ............ |




පියවර 2
**විරුද්ධාර්ථ පද සහිත කාඩ්පත් ලබාදී ගැළපෙන ලෙස සකස්කර කියවීමට දීම'**

පියවර 3
**ඩිමයි කොළයක ලියන ලද වැකි සිසු කණ්ඩායම් වලට හිස්තැන් පිරවීමට ලබාදීම ( කාඩ්පත් තබමින්)**

- **ඉහල අත්තේ අඹ ඉදලා**
- ............ **අත්තේ අඹ ඉදලා**
- **පාසල ඉදිරිපස පාරක් තිබෙනවා**
- **පාසල** ............ **පාරක් තිබෙනවා**
- **අම්මා ගේ පිරිසිදු කරනවා**
- **අම්මා ගේ** ............ **කරනවා**

## 12 ඇගයීම් හා තක්සේරුව -ගතික කණ්ඩායම් වලට වෙන් කිරීම

**පියවර I - යා කිරීමේ අභ්‍යාසයක් ලබාදීම**

| | |
|---|---|
| **යනවා** | **පිටුපස** |
| **ඉදිරිපස** | **එනවා** |
| **පිපෙනවා** | **පහළ** |
| **ඉහළ** | **පිරිසිදු** |
| **අපිරිසුදු** | **පරවෙනවා** |

පියවර 2 - හිස්තැන් පිරවීමට දීම

| | |
|---|---|
| යනවා | .................................... |
| ඉදිරිපස | .................................... |
| ඉහළ | .................................... |
| පිරිසුදු | .................................... |
| පිපෙනවා | .................................... |

පියවර 3

දෙන ලද වාක්‍ය වලට ගැළපෙන විරුද්ධාර්ථ පද යොදා සම්පූර්ණ කරන්න'

1 උදයට මල් .......................... සවසට මල් ......................... ( පරවෙනවා / පිපෙනවා )

2 තාත්තා උදේම වැඩට ............ තාත්තා සවසට වැඩ ඇරී ගෙදර ......... ( යනවා / එනවා )

3 නිවස............... මල් ගස් තිබෙනවා නිවස............... වැටක් තිබෙනවා( පිටුපස / ඉදිරිපස )

## 13 ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය

**තනිව ඉගෙනගන්නා සිසු කණ්ඩායම**

A. දෙන ලද පද වලට අදාළ ව විරුද්ධාර්ථ පද වැඩ පොතෙන් සොයා ලියන්න'

| | |
|---|---|
| ලස්සන | ඉහළ |
| හොඳ | මහත |
| හරි | පිරිසිදු |
| උඩ | යනවා |

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙනගන්නා සිසු කණ්ඩායම**

B. විරුද්ධාර්ථ පද ගළපා යා කරන්න

| | |
|---|---|
| එනවා | අපිරිසිදු |
| ඉහළ | පිටුපස |
| පිරිසිදු | පරවෙනවා |
| ඉදිරිපස | යනවා |
| පිපෙනවා | පහල |

ගුරුවරයාගේ මදක් සහය අවශ්‍ය කණ්ඩායම

C. ගැළපෙන විරුද්ධ පද එකම වර්ණයකින් ලබා දී ගැලපෙන ලෙස සකස් කර ලිවීම'

| | | |
|---|---|---|
| ඉහළ | පහළ | රතු |
| පිරිසිදු | අපිරිසිදු | කොළ |
| ඉදිරිපස | පිටුපස | නිල් |
| එනවා | යනවා | තැඹිලි |

ගුරුවරයාගේ සම්පූර්ණ සහය අවශ්‍ය කණ්ඩායම

D. විරුද්ධාර්ථ පද නැවත සරල ව හඳුන්වා දී විරුද්ධාර්ථ පද 2ක් කිහිප වතාවක් කියවීම. කියවන ලද විරුද්ධාර්ථ පදවලට අදාළ කාඩ්පත් ගැළපීමට දීම'

14' සාරාංශය

විරුද්ධාර්ථ පද නැවත මතක් කර ගුරුවරයා පවසන පදයට ගැළපෙන විරුද්ධාර්ථ පදය පැවසීමට සිසුන්ට අවස්ථාව ලබාදීම'

ඇමුණුම් අංක 1







08. **දිනය** - පලමුවාරය 6 සතිය 1 දිනය

09. **ශ්‍රේණිය** - **2**

10. **විෂය** - **මව්බස**

11. **කාලය** - **මිනිත්තු 60**

12. **ක්ෂේත්‍රය** - R W

13. **නිපුණතාවය** - **සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි'**

14. **ඉගෙනුම් පල** -

- අකුරු එකතුකර වචන සාදා වැකි ලියයි

**08' අතුරු ඉගෙනුම් පල** - ඇලපිල්ල සහිත අකුරු කියවයි

ඇලපිල්ල සහිත වචන කියවයි

ඇලපිල්ල සහිත වචන ලියයි

**09' පාඩම -** ඇලපිල්ල හඳුන්වාදීම

**10' ඉගෙනුම් සම්පත් -** පැවරුම්පත්/ පින්තූර

**11' ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය කණ්ඩායම් / කේවල**

**12' හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්**

**පියවර 1' ගීතයක් මගින්**

**පහත කවිය ඩිමයි කොළයක ලියා ප්‍රදර්ශනය කිරීම. එය තාලයට ගායනා කිරීම**

මාමා නාලා කාලා රාගම යනවා.

තාර පාර ළඟට බබා දන ගා එනවා.

මාලා ගස උඩ නාමල කඩා දානවා

තාරාවා තාලයට පාද තබනවා

කවිය කියමින් ඇලපිල්ල සහිත වචන වලට ඉරි ඇඳීම එම වචන නැවත කියවා ඇලපිල්ල සහිත සඳහා එන ශබ්දය ආ බව හඳුන්වාදීම

**පියවර 2 කතන්දරයක් මගින්**

.. ඇලපිල්ල සහිත වචන කීපයක පින්තූර හා වචන (තාරාවා/ පාසල /හාවා /මාලය/ නළාව/ පනාව) කළු ලෑල්ලේ අලවා එම වචන ශබ්ද නගා කියවීම ඇලපිල්ල සහිත අකුරු නැවත කියවීම ඇලපිල්ලේ ශබ්දය ආ බව මෙහිදී තහවුරු කිරීම

**පියවර** 3 ක්‍රීඩාවක් මගින්

ආ ශබ්දය සහිත වචන කීයූ විට වාඩිවීමටත් අ ශබ්දය සහිත වචන කියූ විට නැගිටීමටත් උපදෙස් දීම ක්‍රීඩාවක් ආකාරයට ඇලපිල්ල හඳුන්වා දීම

## 11 භාවිත ක්‍රියාකාරකම්

**පියවර** I

අකුරු කාඩ්පත් හා ඇලපිල්ල සහිත කාඩ් පත් ලබා දී අකුරට ඉදිරියෙන් ඇලපිල්ල තබා අකුර කියවීම

**පියවර** 2

ඇලපිල්ල සහිත පින්තූර හා වචන ලබාදී ඒවා ගලපා කියවීම

**පියවර** 3

ඇලපිල්ල සහිත වචන තිබෙන පැවරුම්පත් ලබාදී වචනයෙන් අදාළ පින්තූරය ඇලවීම

## 12 ඇගයීම් හා තක්සේරුව -ගතික කණ්ඩායම් වලට වෙන් කිරීම

**පියවර** I ඇලපිල්ල සහිත අකුරු තෝරා රවුම් කරමු


මා ප සා ල ච දා වා ක කා හ රා

.


**පියවර** 2 - ඇලපිල්ල සහිත වචන හා පින්තූර යා කරමු




තාරාවා



මාලය



පනාව



යාවා

**පියවර** 111 අඩු අකුරු යොදා හිස්තැන් පුරවමු

න----------ව (ළා/මා)

------සල      (තා/පා)

ර-----න   (බා/යා)

වර-----(කා/නා)

**13 ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය**

**තනිව ඉගෙනගන්නා සිසු කණ්ඩායම**

A. ඇලපිල්ල සහිත වචන පොතෙන් තෝරා ලියන්න කියවන්න පින්තූර අඳින්න

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙනගන්නා සිසු කණ්ඩායම**

B. ඇලපිල්ල සහිත වචන පෙළ පොතෙන් තෝරා ලියන්න

**ගුරුවරයාගේ මදක් සහය අවශ්‍ය කණ්ඩායම**

C. දෙනලද රූප බලා ඇලපිල්ල සහිත වචන ලිවීමට දීම

**ගුරුවරයාගේ සම්පූර්ණ සහය අවශ්‍ය කණ්ඩායම**

D. **ආ ශබ්දය යෙදුනු වචන සහිත රූප නැවත සරල ව හඳුන්වා දී** ආ ශබ්දය **අදාළ** අකුරු **කාඩ්පත්** සමග **ගැළපීමට දීම'**

**14' සාරාංශය**

ආශබ්දය සහිත වචන සිසු කණ්ඩායම් වලින් ලබාග ගැණිම

**1 දිනය** - පලමු වාරය 7 සතිය 3 දිනය

**2 ශ්‍රේණිය** - 2

**3 විෂය - මව්බස**

**4 කාලය** - මි 60

**5 ක්ෂේත්‍රය** - R W

**6 නිපුණතාවය : කියවීමේ යන්ත්‍රය අනුගමනය කරමින් කියවයි ලිවීමේ යන්ත්‍රය අනුගමනය කරමින් ලියයි.**

**7. ඉගෙනුම් පල : ශබ්ද විභේදන හඳුනාගෙන අකුරු වචන උච්චාරණය කරයි. අකුරු වචන වල විවිධතා හඳුනාගෙන ලියයි.**

1. **ශබ්ධ විභේදන හඳුනාගෙන අකුරු උච්චාරණය කරයි.**
2. **ශබ්ධ විභේදන හඳුනාගෙන වචන උච්චාරණය කරයි.**
3. **අකුරුවල විවිධතා හඳුනාගෙන ලියයි.**
4. **වචන වල විවිධතා හඳුනාගෙන ලියයි.**

**8 පාඩම -දික් ඉස්පිල්ල හඳුනා ගනිමු.**

**9. ඉගෙනුම් සම්පත් : පින්තූරපත් , අකුරු කාඩ්පත් , වචන කාඩ් පත්**

**10. ඉගෙනුම් ක්‍රමවේදය - කේවල / කණ්ඩායම් පැවරුම්පත්**

**11 හඳුන්වා දීමේ ක්‍රියාකාරකම්**

**පියවර 1 පහත කවිය මගින් වචන කිහිපයක් කියවා එහි පළමු අකුරු වල ඇති දික් ඉස්පිල්ල හඳුන්වා දීම.**

**සීතා නැන්දා චිස් ගෙනාවා**

**මීයා ඇවිදින් ඒවා කාලා**

**පූසා දැකලා බිය වූ මීයා**

**වීදුරුවට පැන ලීයට නැග්ගා**

**මෙහිදි දික් ඉස්පිල්ලේ ශබ්ධය ( ඊ ) බවත් හඳුන්වා දීම.**

**පියවර 2 වචන කිහිපයක් ලියූ වචන කෝච්චියක් පන්තිය වටා රවුම් කිහිපයක් ගොස් අපි කෝච්චි පෙට්ටිවල ඇති වචන කියවමු කියලා දික් ඉස්පිල්ල යෙදෙන වචන කියවීම.**

**පියවර 3 පින්තූර කාඩ්පත්යොදා ගනිමින් දික් ඉස්පිල්ල යෙදෙන වචන කියවීම.**

**13 . භාවිත ක්‍රියාකාරකම**

**පියවර 01.සිසු කණ්ඩායම් වලට** දික් ඉස්පිල්ල යෙදූ අකුරු තෝරා තැබීමට අදාළව අකුරු කාටවත් ලබාදී ඒවා අතරින් දික් කිසි පිල්ල යෙදී ඇති අකුරු තෝරා තබා කියවීම

පියවර 02 අකුරු කාඩ්පත් කට්ටල ලබා දී දික් ඉස්පිල්ල යෙදෙන වචන පහක් සාදා කියවීමට දීම

පියවර 03 රූප කාඩ්පත් හා වචන කාඩ්පත් ලබා දී රූපයට අදාළ වචන තෝරා තබා කියවීමට දීම

14 තක්සේරුව හා ඇගයීම

පියවර 1 දික් ඉස්පිල්ල යෙදෙන අකුරු තෝරා රවුම් කිරීමට පැවරුම් පතක් ලබාදීම

පි නී ගි දි

ලී සී මී

රි වි පී


පියවර 2 වචනය කියවා පින්තූර යා කිරීමට දීම



මීයා



වීදුරුව



චීස්

පියවර 3 අඩු අකුරු යොදා හිස්තැන් පිරවීමට අදාළව පැවරුම් පතක් ලබාදීම

---------------- ත්තය (චී/චි )

-----------------සිය (දි/දී)

-----------------තල (නි/සී)

----------------කරු (කී/ම)

**16** ප්‍රතිකාර්ය හා **ඉ**දිරිපෝෂණය

A තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

මව්බස කියවමින් පොත කියවා බලා දික් ඉස්පිල්ල යෙදෙන වචන දහයක් පස්රුල මත බලා ලිවීමට දීම

B යහළුවන්ගේ සහය ඇතිව ඉගෙනගන්නා කණ්ඩායම

පැවරුම් පතේ ඇති වචන කියවා එහි ඇති දික් ඉස්පිල්ල යෙදූ වචන තෝරා පාට කිරීමට දීම

C ගුරුවරයාගේ සහාය මදක් අවශ්‍යා කණ්ඩායම

අකුරු එකතුකර දික් ඉස්පිල්ල යෙදුණු වචන සෑදීමට

D ගුරුවරයාගේ සහාය වැඩිවශයෙන් අවශ්‍යා කණ්ඩායම

දික් ඉස්පිල්ල යෙදෙන විට ඊ ශබ්දය එන බව නැවත හඳුන්වා දී අකුරු කීපයක් යොදා ශබ්ද කියවා දික්ඉස්පිළ්ල යොදා අකුරු දෙකේ වචන දෙකක් සාදා කියවීම හා ලිවීම

17 සාරාංශය දික්කිස්පිල්ල අකුරු වලට යෙදූ විට ඊ ශබ්දය යෙදෙන බවත් එම වචන කීපයක් කියවා පාඩම අවසන් කිරී

01 දිනය - පලමුවාරය 6 සතිය 1 දිනය

02 ශ්‍රේණිය- 2

03 විෂයය- ගණිතය

04 කාලය- මිනිත්තු 60

05 ඒකකය- සංඛ්‍යා එකතු කිරීම

06 නිපුණතාව - එකතුව නමය තෙක් සංඛ්‍යා එකතු කරයි.

07 ඉගෙනුම් පල- එකතුව පහ වන සංඛ්‍යා එකතු කරයි

එකතුව නවය තෙක් සංඛ්‍යා එකතු කරයි

08 පාඩම - එකතුව 9 තෙක් වන සංඛ්‍යා එකතු කරමු

09 වාංමාලාව - එකතු කිරීම/ එකතුව

10 ඉගෙනුම් සම්පත්- රූප කාටවත් ගණක එකේ සිට නමය තෙක් සංඛ්‍යාපත් පටියක්අ

11 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කණ්ඩායම් හා කේවල ක්‍රමය

12 මනෝමය ගණිතය- වට්ටියක අඹ ගෙඩි 4 තවත් වට්ටියක දොඩම් ගෙඩි 4 ඔක්කොම ගෙඩි කීයද?

13 හදුන්වාදීම-

පියවර 1- ගීතයක් මගින්

නිල් පාටින් මල් දෙකයි

කහ පාටින් මල් තුනයි

පාට දෙකෙන් මල් ඔක්කොම

කීයද------ කීයද-------

අතු දෙකේ මල් ගණන් කිරීම

පියවර 2

කතන්දරයක් මගින් ඔන්න පුතේ මට උපන්දිනයට තෑගි ඔට්ටියක් ලැබුණා. ඒකෙ තිබුණේ ලස්සන කොඩි වගේ. පාට රෝස පාට ලස්සන කොඩි. කොඩි වලින් මම මගේ බිත්තිය මගේ බිත්තිය සැරසුවා. බලමු පාට දෙකේ කොඩි කීයක් තිබුණද කියලා අතු දෙකේ මල් ගණන්කර පෙන්වීම.

පියවර 3

+ හා = ලකුණු ප්‍රදර්ශනය කිරීම. එය + කිරීමේ ලකුණන බව තහවුරු කිරීම. එකතුව 10 තෙක් සංඛ්‍යා එකතු කිරීම

3+2=5

6+3=9

5+2=7

15 භාවිත ක්‍රියාකාරකම්-

පියවර 1 සිසුන් කණ්ඩායම්කර වර්ණ දෙකක (එකතුව 5 වන) මල් ඇමූ යෝගට් කෝප්ප දෙකක් හා ඒ මල් ප්‍රමාණයට අදාළ සංඛ්‍යා + හා = ලකුණ සහිත පත්‍රිකා ලබා දීම ද්‍රව්‍ය එකතුකර පිළිතුර ලබා ගැනීමට යොමු කිරීම

පියවර 2 රූප පත්‍රිකා ලබා දී ඒවා ගණන් කර ඔක්කොම කීයදැයි බලා සංඛ්‍යා තැබීම

පියවර 3 එකතුව 10 තෙක් වන වර්ණ දෙකේ සංඛ්‍යාපත් + හා = ලකුණු සහිත පත්‍රිකා ලබාදී වරකට වර්ණ දෙකෙන් එක් සංඛ්‍යා පත බැගින් ගේන එකතු කිරීම හා එම ගැටලු විමය කොළයක ඇලවීම

රවුම් දෙකේ එකතු සංඛ්‍යාවකින් ගෙන එකතු කරන්න ප්‍රතිකාරය හා ඉදිරි පෝෂණ ද්‍රව්‍ය ඇසුරන් එකතු කර සංඛ්‍යා කියවීමට ඉඩ ලැස්වීම ගල්කැට පහක් ලබා දී එකතුව තබා රූප ඇසුරෙන් එකතු කිරීම ඒ ඉදිරි පෝෂණය එකතුව නමයක් එකේ සිට නමය වන සංඛ්‍යාලයෝ දාදු කැට දෙකක් උඩ දහමෙන් හිස් කොටුවට ගැලපෙන සංඛ්‍යාව ලියන්න දෙක හතර හයයි

16 ඇගයීම හා තක්සේරුව

1 පියවර

යා කරන්න එකතුව පහතෙක්

2 පියවර

දෙන ලද රූප ගණන් කරමින් පැවරුම් පතේ හිස්තැන් පිරවීම( රූප 50 ලබා දී හිස්තැන් පිරවීම)

3 පියවර

දෙන ලද වෘත ප්‍රමානයක් දෙකෙන් දෙකට අලවා දෙකෙන් දෙකට ගණන් කරමින් ඊට යටින් අදාල සංඛ්‍යා ලිවීම

16 ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය

1 තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

2 සිට 50 තෙක් තමන් කැමති රූප පාටකරමින් දෙකෙන් දෙකට ගණන් කිරීම

11 යහලුවන්ගේ සහය ඇතුව ඉගෙන ගන්නා කණ්ඩායම

දෙනලද රූප කට්ටලය දෙකෙන් දෙකට ගණන් කරමින් වෙන් කිරිම

111 ගුරුවරයාගේ සහාය මදක් අවශ්‍ය කණ්ඩායම

මල් 30 ක් ලබාදි දෙකෙන් දෙකට අලවමින් ගනන් කිරීමට දීම

1v ගුරුවරයාගේ සහය වැඩිවශයෙන් අවශ්‍ය කණ්ඩායම

වීදුරු බෝල 20 ගෙන දෙකේ ගොඩවල්වලට සකස්කර ගුරුවරයා විසින් ගණන් කර පෙන්වමින් සිසුන් සමග නැවත ගණ්න් කිරීම

වීදුරැ බෝල 20 දෙකේ ගොඩවල් වලට වෙන් කරමින් සිසුන්ට ගණන් කිරීමට දීම

17 සාරාංශය -ඩින්ස් කැට 50 සිසුන් සමග දෙකෙන් දෙකට ගණන් කිරීම

**දිනය** - පලමුවාරය 4 සතිය 3 දිනය

**ශ්‍රේණිය - 2 ශ්‍රේණිය**

**විෂය - මව්බස**

**කාලය - මිනිත්තු හැටයි**

**ක්ෂේත්‍රය** - R W

**නිපුණතාව - කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි. සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.**

**ඉගෙනුම් ඵල - අකුරු එකතු කර වචන සාදයි.**

**පාඩම - මහාප්‍රාණ ධ අකුර හඳුන්වා දීම.**

**ඉගෙනුම් සම්පත් - අකුරු කාඩ්පත්/ වචන කාඩ්පත්**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

**හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්**
පියවර 1 **ධ අකුර සහිත වෙස් මුහුණක් පැළඳ ගුරුතුමිය පහත කවිය ගායනා කිරීම. එය ඩිමයි කොළයක ලියා ප්‍රදර්ශනය කිරීම.**

| | | | |
|---|---|---|---|
| ධ | ධ | ධ | ධජය උසයි |
| ධ | ධ | ධ | ධනය ගෙඩයි |
| ධ | ධ | ධ | යෝධයා එයි |
| ධ | ධ | ධ | ධනපාල හොඳයි |

**පියවර 2 - සරල කතන්දරයක් ඩිමයි කොළයක ලියා ප්‍රදර්ශනය කරමින් එය කියා දෙමින් ධ අකුර හඳුන්වා දීම. එහි ධ අකුර යෙදුණු වචන වෙනත් පාටකින් පෙන්වීම. ශබ්ද කරන අයුරු කියාදීම.**

**කතන්දරය**

**ඔන්න පුතේ එක ගමක හිටියා ධනපාල කියලා ධනවත් මාමා කෙනෙක්. මේ මාමාගේ කඩේට එනවා ගොඩක් අය බඩු ගන්න. ඉතින් පුතේ මේ කඩේ නිතරම කඩේට එන දරුවන්ට සිංහ ධජය ගැන විස්තර කියා දෙන්න මේ මාමා අමතක කළේ නෑ.**

**පියවර 3 - ධ අකුර පස්රුැල මත ලියා ප්‍රදර්ශනය කිරීම.**

**පියවර 4 - අකුර යෙදුණු වචන පැනල් පුවරුවේ ප්‍රදර්ශනය කරමින් ඒවා කියවීම**


| | |
|---|---|
| ධර්මය | ක්‍රෝධය |
| ධනය | අන්ධයා |
| ධනවත් | යුද්ධය |
| වධකයා | ප්‍රධාන |
| යෝධයා | |


**භාවිත ක්‍රියාකාරකම්**

**පියවර 1 - ධ අකුර හා වෙනත් අකුරු සහිත අකුරු කට්ටලයක් ලබාදී ධ අකුර සහිත කාඩ් තේරීම**

**පියවර 2 - විශාලව ලියන ලද ධ අකුර** කඩදාසි **වලින් අලවන්නට කණ්ඩායම්වලට ලබා දීම ( අකුර නිවැරදිව ලියන ආකාරයටම පිළිවෙලින් ඇලවීමට උපදෙස් දීම )**

**පියවර 3 -** ධ **අකුර සහිත වචන ඇතුළත් පත්‍රිකාවක් ලබාදී මහප්‍රාණ අකුරු පමණක් ඇති වචන කපා දෙන ලද මල් මත ඇලවීම.**



**ඇගයීම්**

I

| | | |
|---|---|---|
| ද | ඩ | ධ |
| ධ | ඪ | ධ |
| ට | ඨ | |

II - ධ **අකුර** සහිත වචන කට්ටකයක් ලබා දී වචන වෙන් කිරීමට දීම

III - **අකුර සහිත වචන හතරක් අසා ලිවීම ( ධර්මය/ ධනය/ බුද්ධ/යෝධයා)**

**ප්‍රතිකාර්ය හා ඉදිරි පෝෂනය**

තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

A **කණ්ඩායම - ධ අකුර යෙදෙන වචන පෙළපොතින් (බුද්ධ ධර්මය හා මව්බස කියවීම පොතින් ) සොයා ලිවීම.**

යහළුවන්ගේ සහාය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම

B **කණ්ඩායම - දෙන ලද ඡේදයෙහි ධ අකුර සහිත වචන වලට ඉර ඇඳ එම වචන ලිවීම.( ඇමුණුම 1 ඡේදය )**

ගුරුවරයාගේ සහාය මදක් අවශ්‍ය කණ්ඩායම

C **කණ්ඩායම - දෙන ලද කාඩ්පත්** කට්ටලයකින් **ධ අකුර සහිත වචන තේරීම.**

ගුරුවරයාගේ සහය වැඩිවශයෙන් අවශ්‍ය කණ්ඩායම

C **කණ්ඩායම -** ධ අකුර සහිත කාඩ්පත් මගින් නැවත ධ අකුර හඳුන්වා ම හා වචන කාඩ්පත් මගින් අතුර හඳුන්වාදී ධ අකුර කාඩ්පත් කට්ටලයෙන් වෙන් කිරීමට දීම **පස්රෑලෙහි කඩඉරි මත ලිවීම**

**ඇමුණම 1**

**ධනපාල කියන්නේ ධනවත් කෙනෙක්. එයා ධනවත් වුණේ නිධානයක් ලැබිලා. ධර්මයෙන් ජීවත් වන නිසා ධනපාලගේ ජීවිතය ධර්මානුකූල වුනා. ඔහුගේ ගෙදරට ආව අන්ධ සීයක් කෙනෙකුට එයා හොඳින් සැලකුවා. පින් දුන්න සීයා ධනපාලට ස්තුති කලා.**

**දිනය** - පලමුවාරය 1 සතිය 1 දිනය
**විෂය - ගණිතය**
**කාලය - මිනිත්තු හැටයි**
**ශ්‍රේණිය - 2 ශ්‍රේණිය**
ඒකකය - හැඩය,තරම හා වයනය අනුව ද්‍රව්‍ය තේරීම
**නිපුණතාවය - හැඩය/ තරම/ වයනය අනුව ද්‍රව්‍ය තෝරා වෙන් කළ ආකාරයේ විස්තර කරයි.**
**ඉගෙනුම් ඵල -**

- **හැඩය අනුව වෙන් කරයි**
- **හැඩය අනුව වෙන් කළ ආකාරය ප්‍රකාශ කරයි**
- **හැඩය අනුව වෙන් කර අඳියි**

**පාඩම - හැඩය අනුව ද්‍රව්‍ය තෝරාගනිමු**
**ඉගෙනුම් සම්පත් - හැඩ හතරකින් සකස් කරගත් කොඩි/ පැවරුම්පත** A4 **වලින් කපා ගත් හැඩය වෙනස් සමනලයෝ**

**හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්**

**- කළු ලෑල්ලේ මල් අලවමින් පහත කවිය ගායනා කිරීම.**

**මල් මල් මල් මල් ගනිමු**
**වෙනස් වෙනස් මල් ගනිමු**
**හැඩය අනුව මල් තෝරා**
**ගොඩවල් දෙකකට දමමු**

**(මි .3)**

1. **ඔන්න පුතේ එකමත් එක කාලෙක හිටියා මනුක කියලා පුංචි පිරිමි ළමයෙක්. එයා ළඟ තිබුණා මකන කෑලි ගොඩක්. ඒව දැන් මම ඔයාලටත් පෙන්නන්න යන්නේ. මේ බලන්න මේ මකනේ කොටු හැඩයේ එකක් මේක ත්‍රිකෝණ හැඩේ එකක් ආ මෙන්න මේක රවුම් හැඩයේ එකක්. අනේ ඒක එක විදිහේ හැඩ මකන තියෙනවා. ඔන්න දැන් මට එක වගේ ඒවා එක බෝතලේකට දානවා ලෙස පවසමින් විනිවිද පෙනෙන බෝතල් වලට විවිධ හැඩ මකන දමා හැඩය අනුව වෙන් කිරීම හඳුන්වා දීම.**

**(මි .5)**

2.**එළිමහනේ එක ස්ථානයකට වැලි පිරවූ ටින් තබා හැඩ තුනක කොඩි ඒවායේ රැඳවීම. දරුවන් අතට ඒම හැඩවල කොඩි ලබාදීම. සීමාවක සිට දුවගොස් අතැති කොඩිය හැඩය බලා බඳුනේ රැඳවීමට ලබා දීම. එය ඇසුරෙන් හැඩය අනුව වෙන් කිරීම හඳුන්වා දීම.**

3.**කළු ලැල්ලේ හැඩය වෙනස් සමනලුන් අලවමින් හැඩය අනුව වෙන් කිරීම හඳුන්වා දීම.**

**භාවිත ක්‍රියාකාරකම්**


1. **විවිධ හැඩයේ පෙට්ටි කණ්ඩායම් අතර බෙදා දී ඒවා හැඩය අනුව වෙන් කිරීමට යොමු කිරීම**

2. හැඩ දෙකක **කොඩි කණ්ඩායම්** අතර බෙදා දී ඒවා හැඩය අනුව වෙන්කර වැලි පිරවූ ටින්වල රැඳවීමට යොමු කිරීම මෙය ක්‍රීඩාවක ආකාරයෙන් සිදු කිරීම කළ යුතුය


3. විවිධ හැඩයේ මල් කණ්ඩායම අතර බෙදා දී ඒවා වෙන්කර පැවරුම්පත්වල ඇලවීමට යොමු කිරීම

**තක්සේරු ක්‍රියාකාරකම්**


1. **එකම හැඩයේ සමනල්ලු එකම පාටින් පාට කරන්න.**



2. **හැඩය අනුව වෙන් කර පහත කොටුවල අඳින්න.**



3 **හැඩය අනුව වෙන්කර අලවන්න.**



**ප්‍රතිකාරය හා ඉදිරි පෝෂණ ක්‍රියාකාරකම්**

තනිව ඉගෙනගන්නා කණ්ඩායම

A. **හැඩ 3 සහිත රූප පත්‍රිකාවක් ලබා දී පාට කර වට කපා හැඩය අනුව වෙන් කර අලවන්න**

යහළුවන්ගේ සහය ඇතුව ඉගෙනගන්නා කණ්ඩායම

B. **රූප කට්ටලයක් ලබාදී හැඩය අනුව වෙන් කර අලවන්න**

ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

C. **ලබා දෙන කොඩි හැඩය අනුව වෙන්කර වැලි පිරවූ බඳුන්වල රැඳවීම**

ගුරුවරයාගේ සහය සම්පූර්ණයෙන් අවශ්‍ය කණ්ඩායම

D. **ගුරුවරයා විසින් ද්‍රව්‍ය දෙකක් ගෙන එය නැවත හඳුන්වාදී ඒවායේ හැඩ විස්තර කර වෙන් කිරීමට ලබා දීම .**

**දිනය** - දෙවනවාරය 1 වන සතිය 1 දිනය

**ශ්‍රේණිය - 2 ශ්‍රේණිය**

**විෂය - ගණිතය**

**කාලය - මිනිත්තු හැටයි**

**ඒකකය - ද්‍රව්‍ය/ රූප ගණන් කිරීම.**

**නිපුනතාවේ -එකම වර්ගයේ රූප 50ක් ගණන් කරයි**

**ඉගෙනුම් ඵල -**

- **එකම වර්ගයේ රූප 10ක් ගණන් කරයි**
- **එකම වර්ගයේ රූප 10ක් හඳුනා ගනී**
- **එකම වර්ගයේ රූප 10ක් රූප ගණන් කරයි.**

**පාඩම - එකම වර්ගයේ රූප දහයක් ගණන් කිරීම.**

**ඉගෙනුම් සම්පත්- පාට A4 / රූපපත් / බ්‍රිසිල් බෝඩ් / පාට / කතුරු / ගම්**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවල / කණ්ඩායම්**
**ප්‍රවේශය - පහත කවිය ගායනා කරමින් ගණන් කර පෙන්වීම.**

**යට ඉත්තේ මල් පිපිලා මල් දෙකයි**
**උඩ ඉත්තේ මල් පිපිලා මල් හතරයි**
**අර අත්තේ මල් පිපිලා මල් හයයි**
**මැද අතේ මල් පිපිලා මල් අටයි**

**හඳුන්වාදීමේ ක්‍රියාකාරකම් -**

**පියවර 1 - බැලුන් මාමා බැලුම් විකුණන ආකාරයේ භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කර බැලුන් ගණන් කර පෙන්වීම.**

**පියවර 2 - ගසක පින්තූරයක් කළු ලෑල්ලේ අලවා මල් අටක් ගණන් කර පෙන්වීම. එමගින් අටක් ගණන් කර පෙන්වීම.**

**පියවර 3 - කතන්දරයක් මගින් තොප්පි ගණන් කර පෙන්වීම.**
**වෙළෙන්දෙක් තොප්පි විකුණ විකුණ යනවා. එක එක්කෙනා තොප්පි ගත් ආකාරයට සිසුන් දහදෙනෙකුට අහඹු ලෙස තොප්පි හිසට දමා ගොස් ඒවා ගණන් කිරීම.**


**භාවිත ක්‍රියාකාරකම් -**

**පියවර 1 - පින්තූර මගින් සකසා ගත් සමනල් රූප ආධාරක මත රඳවා ටින් එකක් සමග කණ්ඩායම් වලට ලබා දී එතනින් සමනලුන් පහක් ගණන් කර ටින් එක මත ගැසීම.**


පියවර 2 - ඇපල් ගෙඩි රූප හා ඩිමයි කොළ කණ්ඩායමකට ලබා දී ඇපල් ගෙඩි අටක් ගණන් කර ඇලවීමට දීම.
පියවර 3 - රූප කාඩ්පත් ලබා දී එමගින් රූප දහයක් ගණන් කර මේසේ මත තැබීමට අදාළ රූප කාඩ්පත් කණ්ඩායම්වලට ලබා දීම.

තක්සේරු ක්‍රියාකාරකම් -


පියවර 1 - මල් අඳින ලද පින්තූර පත්‍රිකාවක් ලබා දී මල් පහක් රවුම් කිරීම.



පියවර 2 - පින්තූර අටක් හරි දමමින් ගා පින්තූර අටක් හරි දමමින් ගණන් කිරීම.




පියවර 3 - රූප දහයක් ගණන් කර පාට කිරීම කිරීමට දීම.



ඉදිරිපෝෂණය හා ප්‍රතිකාර්ය -

A. රූප අඳින ලද කොළයක් ලබාදී එහි රූප දහයක් පාට කර ඒ වටා කපා ගණන් කර ඇලවීම.



B. **රූප කිහිපයක් ඇඳලා දී දහයක් වීමට ඉතුරු ගන්න ඇඳ පාට කිරීම.**


  .................. ..................

.................. .................. .................. ..................

.................. .................. .................. ..................

C. **ගණන් කර රූප දහයක් තනි ඇඳ පාට කිරීම.**

D. ගුරුවරයා රූප **මගින් ගණන් කිරීම** හා එමරූප සිසුන් සමග කපා වෙන්කර ගණන් **කරමින් ඇලවීම රූපකාපත් පහත පරිදි වේ.**



( **මිනිත්තු 12** )

01. **දිනය** - දෙවන වාරය 10 **වන සතිය**

02. **ශ්‍රේණිය** - **3**

03. **විෂය** - **මව්බස**

04. **කාලය** - **මිනිත්තු 60**

05. **ක්ෂේත්‍රය** - LSRW

06. **නිපුණතාවය** - $L_5S_5R_5W_5$

07. **ඉගෙනුම් පල** - **වංමාලාව පෝෂණය සඳහා වචන එක් රැස්කර භාවිතා කරයි'**

08. **අතුරු ඉගෙනුම් පල** - **සමානාර්ථ පද යනු කුමක්දැයි හඳුනාගනියි'**
**සමානාර්ථ පද තෝරාගෙන කියවයි'**
**දෙන ලද වචනවලට සමානාර්ථ පද තෝරා ලියයි'**

**09' පාඩම/ ක්‍රියාකාරකම** - **සමානාර්ථ පද**


09. **ඉගෙනුම් සම්පත්** - **බැලුම් බෝල ඩිමයි කොළ ගිනිපෙට්ටි බ්‍රිස්ටල් බෝඩ් කුහර පුවරු**

10. **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය- කේවළ / කණ්ඩායම්**

11. **හඳුන්වාදීමේ ක්‍රියාකාරකම් - ගීතයක් මගින්**

**ගස ලොකුයි**
**රුක ලොකුයි**
**අහස ලස්සනයි**
**ගුවන ලස්සනයි**
**ඉර එබෙයි**
**හිරු එබෙයි**
**ඇස් දිහා බලයි**
**නෙත් දිහා බලයි**

**පහත රූප කෝටුවල රඳවාගෙන ගායනා කරමින් හඳුන්වාදීම.**



2 - කතන්දරයක් මගින්

දවසක් නිමල් උදෑසනම විදුහලට ගියා. පාසල තුළ අවසාන සීනුව වැදුණු පසු නිමල් ගෙදර යන්න සූදානම් වුණා. ගෙදර යන අතරමග දී නිමල් දුටුවා ලොකු රුකක අඹ පිරී තිබෙනවා. ගසට නැග්ග නිමල් අඹ ගෙඩියක් කඩාගෙන පාර දෙසට දිව ගියා. මාර්ගයේ පැමිණි බසය නිමල්ට නිවසට යෑමට නතර කළා. නිමල් තමා ගෙදර පැමිණි බව නිමල් අම්මාට පැවසුවේ ය.එතනට පැමිණි මව පාසලේ කරන ලද වැඩ ගැන විමසා ඔහුගේ හිස අතගෑවා ය.

❖ කතන්දරේ ප්‍රදර්ශනය කිරීම හා ප්‍රදර්ශනය කරන ලද කතන්දරේ කියවමින් සමානාර්ථ පදවලට ඉරි අඳිමින් සමානාර්ථ පද හඳුන්වාදීම.


3' පියවර


❖ සමානාර්ථ පද සහිත කාඩ්පත් පෙට්ටියකට දමා තැබීම' එහි සඳහන් කාඩ්පත් එකින් එක රැගෙන ගුරුවරයාට ලබා දෙන ලෙස පැවසීම. ඊට පසු ලබා දෙන කාඩ්වත් අනුව කුහර පුවරුවේ ගැළපෙන ලෙස රඳවමින් සමානාර්ථ පද ගොඩනැගීම හා කියවීම.

1. ප්‍රවෘත්තිය - පුවත
2. රාත්‍රිය - රැය
3. දූපත - දිවයින
4. කැලෑව - වනය
5. ඔළුව - හිස

12' භාවිත ක්‍රියාකාරකම්

☞' එකම වර්ණ යුගළවලින් අලවන ලද ගිනිපෙට්ටිවල සමානාර්ථ පද ලියා එක් එක් කණ්ඩායම්වලට සමානාර්ථ පද ගැළපීම. ( සමානාර්ථ පද යුගලයකට එකම වර්ණයෙන් ඇල වූ ගිනිපෙට්ටි දෙක බැගින් ලබාදීම )




II. කාඩ්පත් ක්‍රීඩාව

රතු පාටින් ලියන ලද පහත සඳහන් කාඩ්පත් කණ්ඩායමේ එක් දරුවකුට ලබාදීම.( ප්‍රවෘත්තිය, රාත්‍රිය, දූපත , කැලෑව, ඔළුව) නිල් පැහැයෙන් ලියන ලද පහත සඳහන් වචන කාඩ්පත් කට්ටලය බැගින් කණ්ඩායමේ අනෙක් සිසුන්ට ලබාදීම (පුවත , රැය, දිවයින, වනය, හිස) රතුපාට කාඩ් පත සහිත සිසුවා එක් කාඩ්පතක් කණ්ඩායම මැදට දැමූ විට ඊට අදාළ සමාන පද සහිත නිල් කාඩ්පත් ඇති සිසුන් ඊට අදාළ සමානාර්ථ පදය කණ්ඩායම් මැදට දැමීම. මේ අයුරින් කාඩ්පත් සියල්ල අවසන් වන තුරු ක්‍රීඩාවක් ලෙස සිදුකිරීම'

III. **පහත සඳහන් සමානාර්ථ පද ලියූ කාඩ්පත් ලබාදී ගැළපෙන ලෙස ඩිමයි කොළයක් මත ඇලවීම සිසුන් ලවා කියවීම.**

| | |
|---|---|
| උදෑසන | හිමිදිරිය |
| කුරුල්ලා | පක්ෂියා |
| පොත | ග්‍රන්ථය |
| වතුර | ජලය |
| පාදය | කකුල |

**13' ඇගයීම - වගුවක් ලබාදීම හිස්තැන් පිරවීම**

**1' සමානාර්ථ පද ලියා යා කිරීම.**

| | |
|---|---|
| ගස | තරු |
| පාසල | පියා |
| තාරකා | විදුහල |
| තාත්තා | රුක |

**2' වගුවක් ලබාදීම හිස්තැන් පිරවීම**

| | |
|---|---|
| ප්‍රවෘත්තිය | |
| දූපත | |
| හිස | වනය |
| | ග්‍රන්ථය |
| වතුර | |
| කකුල | |
| උදෑසන | |
| | අම්මා |
| | ඉර |

**14' ඉඳිරි පෝෂණය හා ප්‍රතිකාර්ය - ගතික කණ්ඩායම් වෙන් කිරීම**

**තනිවම ඉගෙනගන්නා කණ්ඩායම**

A. **පහත දෙන ලද වචනවලට ගැළපෙන සමානාර්ථ පද ලියන්න.**

1. **ප්‍රවෘත්තිය** -
2. **පියා** -
3. **ග්‍රන්ථ** -
4. **පක්ෂයා** -
5. **හිමිදිරිය** -

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙනගන්නා කණ්ඩායම**

B. **සමානාර්ථ පද සහිත කාඩ්පත් කට්ටලයක් ලබාදී ඒවා ගැළපීම.**

| | | | | | |
|---|---|---|---|---|---|
| **ගස** | **රුක** | **පය** | **පාදය** | **පොත** | **ග්‍රන්ථය** |
| **උදෑසන** | **හිමිදිරිය** | | | | |


**ගුරුවරයාගේ මදක් සහය අවශ්‍ය කණ්ඩායම**

C. **ගැළපෙන සමානාර්ථ පදය සොයා යා කිරීම**


| | |
|---|---|
| **ගස** | **තරු** |
| **පාසල** | **පියා** |
| **තාරකා** | **විදුහල** |
| **තාත්තා** | **රුක** |


**ගුරුවරයාගේ සම්පූර්ණ සහය අවශ්‍ය කණ්ඩායම**

D. **ගුරුවරයා සමඟ කියවමින් සමානාර්ථ පද ගැළපීමට ලබාදීම**


**ගස**


**රුක**


**ඉර**


**හිරු**

**සාරාංශය -**

**සමානාර්ථ පද යනු කුමක්දැයි නැවත මතක් කර 2 ශ්‍රේණියේ ඉගෙන ගත් සමානාර්ථ පද මතකයෙන් කියවීම හා 3 ශ්‍රේණියේ ඉගෙන ගත් සමානාර්ථ පද නැවත මතක් කිරීම'**

**01' දිනය** - පලමු වාරය 5 සතිය

01. **ශ්‍රේණිය** - **3**

02. **විෂය** - **මව්බස**

03. **කාලය** - **මිනිත්තු 60**

04. **ක්ෂේත්‍රය** - RW

05. **නිපුණතාවය** - **කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි. සම්මත නිවැරදි ක්‍රමයට ලියයි.**

06. **ඉගෙනුම් පලය** - **කියවීමේ කුසලතා ප්‍රදර්ශනය කරමින් ශබ්ද නගා කියවයි '/ ලියයි'**

07. **අතුරු ඉගෙනුම් පල** - අකුරු එකතු කර වචන කියවයි / ලියයි'
අකුරු තුනක් එකතු කර වචන කියවයි / ලියයි'
ඇලපිල්ල සහිත ඕනෑම වචනක් කියවයි / ලියයි'

08. **පාඩම** - **ආ ශබ්දය හඳුන්වාදීම'**

09. **ඉගෙනුම් සම්පත්** - **අත් රබාන, පින්තූර ,වචන පත්‍රිකා**

10. **ඉගෙනුම් ක්‍රමවේදය** - **කේවල සහ කණ්ඩායම්**

11. **හඳුන්වාදීම** -

**1' ගීතයක් මඟින්**


මාලයකට මුතු අමුණා
තාලයකට පද ගළපා
නාදයකට සවන යොමා
සාදයකට නටති ළමා

**ගීතය කළු ලෑල්ලේ ප්‍රදර්ශනය කර ඇලපිල්ල යෙදී ඇති අක්ෂරවලට ඉරිගසමින් ශබ්ද නගා කියවීම. ඇසෙන ශබ්දය ආ බව හඳුන්වා දීම.**


**2' කතන්දරයක් මගින්**

**තාරාවෙක් හරි සතුටින් විලක පීන පීන හිටියා. එතනට ලස්සන මාළුවෙක් ආවා.දෙන්නම හරි සතුටින් පීන පීනා හිටියා. මේක බලන් හිටිය දියකාවා වේගයෙන් ඒ දෙන්නා ළඟට ආවා. බයවුණු මේ දෙන්නා වේගයෙන් ඈතට පීනලා හැංගුණා.**


**කතන්දරේ කියන ගමන් ඇලපිල්ල යෙදුණු වචන පින්තූර පෙන්වමින් ශබ්ද නගා නැවත වරක් කියවීම**



තාරාවා



මාළුවා



දියකාවා

03 පහත සඳහන් වචන පත්‍රිකා සකස් කර ප්‍රදර්ශනය කිරීම' වමේ සිට දකුණට වචන කියවීම' " ආ " ශබ්දය සඳහා ඇලපිල්ල යෙදී ඇති බව හඳුන්වාදීම'

සවස - සාලය
පහත - පාලම
දහය - දාරය
වනය - වාරය

**භාවිත ක්‍රියාකාරකම්**

1. විවිධ පිල්ලම් යෙදුණු අකුරු කුඩා පෙට්ටියකට දමා ලබා දී ඇලපිල්ල (ආ ශබ්දය) ඇති අකුරු තේරීම.

කා ,නෙ, සැ ,ලා, වා ,සා
පැ, මා ,පො, බු, ජෝ ,දෙ

2. පින්තූර සහිත වචන කිහිපයක් ලබා දී මුල් අකුරට ඇලපිල්ල යෙදී ඇති වචන තෝරා ඩිමයි කොළයක අලවා ඉදිරියෙන් ලිවීමට සැලැස්වීම.

පහන, පාසල , දවස, දාරය, කසය, කාරය, මකනය, මාලය

3. වචන කාඩ්පත් කණ්ඩායම් අතර ලබා දී " පහන " වචනය මුලට ගෙන අවසාන අකුරට ඇලපිල්ල( ආ ශබ්දය) යොදා වචන මාලය සෑදීම

පහන ⟶ නාදය ⟶ යාන ⟶ නාමල ⟶ ලාමක ⟶ රාක්ක

ඇගයීම හා තක්සේරුව --ගතික කණ්ඩායම් වෙන් කිරීම

1. ලබා දෙන වචනවල මුල් අකුරට ඇලපිල්ල යොදා වචන කියවීම හා ලිවීම'

   මල -  පද-  තල-  කල  දර  නද  ගල

2. තාරාවා , නළාව , පනාව , රබාන , මාලය පින්තූර ලබා දී ඊට අදාළ වචන ලිවීම'

3. ඇලපිල්ල යෙදුනු අකුරු සහිත පින්තූර සකස් කරගෙන ඊට අදාළ වචන ලිවීම.

4. හිස්තැනට සුදුසු අකුරු යොදා වචන සම්පූර්ණ කිරීම හා ලිවීම.

   ii.ප ................ ව (න/නා)

   iii................. ලය (කා / කි)

   iv................. ලය (ම/ මා)

   v................. ලම (පා / ප)

   vi................. දය (ස / සා)


ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය - ගතික කණ්ඩායම්

**තනිව ඉගෙන ගන්නා කණ්ඩායම**

A. දාදු කැටයක ඇලපිල්ල සහිත අකුරු අලවා උඩ දමමින් එම අකුරට වචනයක් කියවා එය ලිවීම.

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

B. අකුරු ගළපා වචන ගොඩනැගීම.




**ගුරුවරයාගේ මඳක් සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

C. පිල්ලම් රහිත අකුරු දෙකේ වචන කිහිපයක් ලබාදී මුල අකුරට ඇලපිල්ල යොදා ලිවීම හා කියවීම'

- ගල - ගාල
- මල - මාල
- වද- වාද
- බර- බාර

**ගුරුවරයාගේ මදක් සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

D. **පිල්ලම් රහිත අකුරු හා ඇලපිල්ල ලබා දී අකුරට පිල්ලම් යොදා කියවීම හා ලිවීම**

**ප - පා**

**සාරාංශය - අකුරු දෙකේ වචන හා තුනේ වචන නැවත මතක් කර එම වචනවලට ඇලපිල්ල යොදා නැවත කියවීම' ඇලපිල්ල සහිත ලියූ වචන නැවත මතක් කර කියවීමට සැලැස්වීම '**

01 දිනය - පලමුවාරය 8 සතිය 1දිනය

02 ශ්‍රේණිය- 3

03 විෂයය- ගණිතය

04 කාලය- මිනිත්තු 60

05 ඒකකය- ඝනවස්තු හා හැඩතල

06 නිපුණතාව - ඝනවස්තු හා ජ්‍යාමිතික හැඩතලවල ලක්ෂණ හා ස්වභාවය හඳුනාගෙන ක්‍රියාකාරකම් නිරත වෙයි. ඉගෙනුම් පල- ජ්‍යාමිතික හැඩතල ලක්ෂණ නම් කරයි

1සමචතුරස්‍රයේ ලක්ෂණ ප්‍රකාශ කරයි

2 සාජුකෝණාස්‍රයේ ලක්ෂණ ප්‍රකාශ කරයි

3 වෘත්තයේ ලක්ෂණ ප්‍රකාශ කරයි

4 ත්‍රිකෝණයේ ලක්ෂණ ප්‍රකාශ කරයි

07 පාඩම - හැඩතල ලස්සන

08 ඉගෙනුම් සම්පත්- ඝන කඩදාසිවලින් සකසා ගත් සමචතුරස්‍ර/ සෘජුකෝණාස්‍ර /ත්‍රිකෝණ /වෘත්ත

09 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කණ්ඩායම් හා කේවල ක්‍රමය


10 මනෝමය ගණිතය- අත්තක කුරුල්ලෝ පහළොවක් සිටි අතර ඉගිලී ගිය කුරුල්ලෝ ගණන දහයක් විය

ඉතිරි කුරුල්ලන් ගණන කීයද?

11 හඳුන්වාදීම- කතන්දරයක් මගින්

පියවර 1- එකමත් එක රටක ඉතාමත් ලස්සන රාජ කුමාරියක් හිටියා මේ කුමාරි ඉතාමත් අලංකාර මාල පළඳිනවා. ඉතින් රජමාලිගාවේ රාජාභිෂේකයට ලොකු උත්සවයක් තිබුණා . මේ රජ කුමාරි මාල පාලදාගෙන හිටියා. සමචතුරස්‍රවලින් මාලයක් ,සෘජුකෝණාස්‍රවලින් මාලයක්, වෘත්ත හැඩයෙන් මාලයක් පලදාගෙන සිටියා. උත්සව කටයුතු අවසන් වී රජ කුමරිය චතුරස්‍ර හැඩැති මාලය ගලවා පැති හතරම එක සමානයි කියමින් මාලය ගලවා එල්ලයි දෙවන මාලය පැති දෙකක් සමානයි යනුවෙන් පවසමින් එම මාල ගලවා එල්ලයි. මේ ආකාරයෙන් කතන්දරය ගොඩනගන්න.

පියවර 2 ගීතයක් මගින්



වහලත් මගේ හැඩය වගේ

වීස් කැල්ලත් වගේ.

පැති තුනකින් සැරසෙන මම

ත්‍රිකෝණයයි හරි නම මගේ




හරි හතැස් කොටුවකි

පැති ඔක්කොම සමවෙති

එක එක පාටින් ඇති

මම සමචතුරශ්‍රය වෙමි




පාද හතරකින් යුතුලු

සම්මුඛ පැති සමානලු

අපි හැමෝම දන්නවලු

සෘජුකෝණාස්‍රය මමලු



රවුම් මූහුණ මට ඇතේ


වටකුරු යැයි පවසතේ

ප්‍රමානයෙන් දස අතේ

වෘත්ත යයි හරි නම මගේ

ඉහත ගීත ගායනා කරමින් හදුන්වා දෙන්න

පියවර 3 හැඩතල භාවිත කරමින් පහත රූපය නිර්මාණය කර පෙන්වීම හා එක් එක් හැඩතලය විස්තර කර දීම



13 භාවිත ක්‍රියාකාරකම්-

පියවර 1 හැඩතල කට්ටලයක් ලබා දී ලක්ෂණ අනුව ගොඩවල්වලට වෙන්කර ප්‍රකාශ කිරීමට දීම.


පියවර 2 සුදු A4 කොළ ලබාදී හැඩතල කපා පාටකර ඩිමයි කොළයක ඇලවීම

පියවර 3 හැඩතල වලින් කණ්ඩායමක්ලෙස එක්ව රූපයක් නිර්මාණය කිරීම

14 ඇගයීම

1 හැඩතල කට්ටලයක් ලබාදී . ලක්ෂණ අනුව වෙන් කිරීමට උපදෙස් දෙන්න. වෙන් කරන ආකාරය මත අගයන්න

2 යා කරන්න




සමචතුරස්‍රය



වෘත්තය



ත්‍රිකෝණය



සෘජුකෝණාස්‍රය

3 දෙනලද හැඩතලවලින් රූපයක් නිර්මාණය කරන්න

15 ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය

1 තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

එක් වර්ගයකින් හැඩතල දෙකකට වැඩියෙන් යොදාගෙන නිර්මාණයක් කරන්න. එය පන්තියේ ප්‍රදර්ශනය කරන්න

11 යහළුවන්ගේ සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම

වෘත්තය/ සමචතුරස්‍රය/ඍජුකෝණාස්‍රය/ත්‍රිකෝණය ඇද පාටකර නම්කරන්න

111 ගුරුවරයාගේ සහාය මදක් අවශ්‍ය කණ්ඩායම

පහත සදහන් හැඩතලවල නම් වරහන් තුළින් තෝරා ලියන්න



1v ගුරුවරයාගේ සහය සම්පූර්ණයෙන් අවශ්‍ය කණ්ඩායම

හැඩතල හතර ගුරුවරයා විසින් එකින් එක ගෙන දරුවන්ට වෙන්වෙන්ව පෙන්වමින් නැවත හදුන්වාදීම

හැඩතලය සමග ඊට අදාළ නම තබා පෙන්වමින් විස්තර කිරීම



අදාළ හැඩතලය මත ඊට අදාළ නම තැබීමට දීම

16 සාරාංශය -අදාළ හැඩතල හතර නැවත ප්‍රකාශකොට ඒවාට උදාහරණ දී පාඩම අවසන් කිරීම

01 දිනය - පලමුවාරය 1 සතිය 3 දිනය

02 ශ්‍රේණිය- 3

03 විෂයය- ගණිතය

04 කාලය- මිනිත්තු 60

05 ඒකකය- ගණන් කිරීම

06 නිපුණතාව - ද්‍රව්‍ය රූප ගණන් කරයි.

07 ඉගෙනුම් පල - එකම වර්ගයේ ද්‍රව්‍ය රූප ද සීයට නොවැඩි සංඛ්‍යාවක් දෙකේ ඒවායෙන් ගණන් කරයි

1 ද්‍රව්‍ය රූප 20 ක් දෙකේ ඒවායින් ගණන් කරයි

2 ද්‍රව්‍ය රූප 50 ක් දෙකේ ඒවායින් ගණන් කරයි

3 ද්‍රව්‍ය රූප ගණන් කරමින් ලියයි

08 පාඩම - ද්‍රව්‍ය රූප 50 ක් දෙකේ ඒවායින් ගණන් කිරීම

09 වාංමාලාව - දෙක බැගින්

10 ඉගෙනුම් සම්පත්- ඩීන්ස් කැට, පැවරුම්පත්,. වීදුරු බෝල ඩිමයි කොළ, තරුකාඩ්, රූප හා ද්‍රව්‍ය

11 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කණ්ඩායම් හා කේවල ක්‍රමය

12 මනෝමය ගණිතය- අත්තක දොඩම් ගෙඩි 18ක් තිබිණි ඉන් ගෙඩි හතරක් බිවට වැටුණි දැන් අත්තේ ඉතිරි දොඩම් ගණන කීයද?

13 හඳුන්වාදීම- ගීතයක් මගින්.

පියවර 1- ගීතයක් මගින් දෙකෙන් දෙකට ගණන් කිරීම හඳුන්වාදීම

පාට පාට වීදුරු බෝල

හරි ලස්සන වීදුරු බෝල

ගණන් කරමු වීදුරු බෝල

දෙකෙන් දෙකට ගනිමු ද බෝල

දෙක හතර හයයි වීදුරු බෝල

අට දහය දොළහ වීදුරු බෝල

දෙකෙන් දෙකට අපි ගනිමු ද බෝල

හරි ලස්සන මේ වීදුරු බෝල

ගීතය ගයමින් වීදුරු බෝල 20 ගණන් කිරීම

පියවර 2

බැලුම් බෝල දෙක බැගින් බැලුම් බෝල 20දෙකෙන් දෙකට ගණන් කරමින් වැලි පිරවූ බඳුනක රුඳවීම.

පියවර 3


කතන්දරයක් ඇසුරෙන් දෙකෙන් දෙකට ගණන් කිරීම හඳුන්වාදීම

ඔන්න පුතේ අද අපිට විශේෂ දවසක් පාසලේ අධ්‍යාපන චාරිකාව සඳහා දරුවෝ හැමෝම උදෙන්ම ඇවිල්ලා හැමෝම බස් රථයට ගොඩ වෙන්න ඕන හරියට. ඒ නිසා යාළුවෝ දෙන්න දෙන්න අත් අල්ලගන්න. ඒ ඒක ආසනයක දෙන්නෙකුට ඉඳගන්න පුළුවන් දැන් මම දරුවො ටික ගණන් කරන්න ලෑස්තියි. දෙදෙනා බැගින් අත්අල්ලා ගත් නිසා  මට ගණන් කරන්න ලේසියි කියමින් ගුරුතුමා ගණන් කරන්න පටන් ගත්තා( දෙක,හතර,හය ,අට,දහය,දොළහ ලෙස ගණන් කරමින්) ගණන් කරලා ඉවර වෙද්දී ළමයි පනහක් හිටියා දෙකෙන් දෙකට  ගණන් කළ නිසාම ගුරුතුමියට ලේසි වුණා.හැමෝම සතුටින් බස් රථයට ගොඩ වුණා.(මේ ආකාරයට කිහිපවරක් ගණන් කර පෙන්වීම)

15 භාවිත ක්‍රියාකාරකම්-


පියවර 1 ද්‍රව්‍ය විස්සකින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් ලබා දී ඒවා දෙකෙන් දෙකට කණ්ඩායමක් ලෙස ගණන් කිරීම.

පියවර 2 කණ්ඩායම්වලට මල් පනහ බැගින් ලබා දී දෙකෙන් දෙකට මල් වෙන්කර ඇලවීමට හා ගණන් කිරීම.



2 4 6


පියවර 3  කණ්ඩායම්වලට ද්‍රව්‍ය (ඩීන්ස් කැට 50 ) ලබා දී එම ද්‍රව්‍ය  දෙකෙන් දෙකට වෙන් කර සංඛ්‍යා කාඩ්පත් කට්ටලය සමග ද්‍රව්‍ය තැබීම



2 4 6 8

16 ඇගයීම හා තක්සේරුව

1 පැවරුම්පතක් ලබා දී ද්‍රව්‍ය රූප දෙකෙන් දෙකට ගණන් කර අදාළ සංඛ්‍යාව මත තැබීම



------ ------- ------- --------

2 පියවර දෙන ලද රූප ගණන් කරමින් පැවරුම් පතේ හිස්තැන් පිරවීම රූප 50 ලබා දී හිස්තැන් පිරවීම.

3 පියවර දෙන ලද වෘත්ත ප්‍රමාණයක් දෙකෙන් දෙකට අලවා දෙකෙන් දෙකට ගණන් කරමින් ඊට යටින් අදාළ සංඛ්‍යා ලිවීම.

16 ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය

1 තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

2 සිට 50 තෙක් තමන් කැමති රූප පාට කරමින් දෙකෙන් දෙකට ගණන් කිරීම

11 යහළුවන්ගේ සහය ඇතුව ඉගෙන ගන්නා කණ්ඩායම

දෙන ලද රූප කට්ටලය දෙකෙන් දෙකට ගණන් කරමින් වෙන් කිරීම

111 ගුරුවරයාගේ සහාය මදක් අවශ්‍ය කණ්ඩායම

මල් 30 ක් ලබා දී දෙකෙන් දෙකට අලවමින් ගණන් කිරීමට දීම

1V ගුරුවරයාගේ සහය වැඩිවශයෙන් අවශ්‍ය කණ්ඩායම

වීදුරු බෝල 20 ගෙන දෙකේ ගොඩවල්වලට සකස්කර ගුරුවරයා විසින් ගණන් කර පෙන්වමින් සිසුන් සමග නැවත ගණන් කිරීම

වීදුරු බෝල 20 දෙකේ ගොඩවල්වලට වෙන් කරමින් සිසුන්ට ගණන් කිරීමට දීම

17 සාරාංශය -ඩීන්ස් කැට 50 සිසුන් සමග දෙකෙන් දෙකට ගණන් කිරීම

**දිනය** - පලමු වාරය 5 සතිය 1 දවස

**ශ්‍රේණිය** - 3

**විෂය - ගණිතය**

**කාලය - මිනිත්තු 60**

**ඒකකය - සංඛ්‍යා අඩු කිරීම**

**නිපුණතාවය - සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳයි**

**ඉගෙනුම්** පල **- නවයට නොවැඩි සංඛ්‍යාවක් ඊට සංඛ්‍යාවක් අඩු කර පිළිතුරු ප්‍රකාශ කරයි.**

**පාඩම - නවයට නොඅඩු සංඛ්‍යාවක් ඊට අඩු සංඛ්‍යාවකින් අඩු කිරීම.**

**ඉගෙනුම් සම්පත් - ගණක/ ඕන්ස් කැට/ රූප පත්‍රිකා/ සංඛ්‍යා පත්**

**මනෝමය ගණිතය - අත්තක කුරුල්ලෝ පහක් හිටියා තවත් කුරුල්ලෙක් ඇවිත් අත්තක වැහුවා. අත්තේ ඔක්කොම කුරුල්ලෝ ගණන කීයද?**

**හඳුන්වාදීමේ ක්‍රියාකාරකම -**

1. **ගීතයක් මගින්**

   **නටුව සහිත ඇති මල් තුනක් ගෙන මෙම ගීතය ගායනා කිරීම**

   **එකයි දෙකයි තුනයි (මල් තුන ගණන් කරමින් පෙන්වීම)**
   **හැබැයි තුනෙන් දෙකක් එකයි (මල් තුනෙන් දෙකක් ඉවත් කර ඉතිරි එක පෙන්වීම)**
   **දැන් මගේ අතේ තියෙන්නෙ මල් ගොඩෙන් දෙකයි.**


2. **ක්‍රීඩාවක් මගින්**
   **සිසුන් එළිමහනට රැගෙන යාම. සිසුන් රවුමට පෙළ ගැසී විනිවිධ පෙනෙන භාජනයකට කැරට් නවයක් දැමීම. භාජන ඉදිරිපස එම සංඛ්‍යාව ප්‍රදර්ශනය කිරීම. හාවා පැන පැන ගොස් කැරට් අලය කෑ අතර ඉතිරිය ගණන් කරමින් සෙවීම.**

3. **රූපයක් මගින්**
   **ප්‍රදර්ශනය කරන ලද ජම්බු ගසක ජම්බු ගෙඩි නවයක් අලවා එයින් ජම්බු ගෙඩි හතරක් සත්තු කෑවා යැයි පවසා එයින් ඉවත් කිරීම. ඉතිරි ජම්බු ගෙඩි ගණන් කරමින් ප්‍රකාශ කිරීම.**


**භාවිත ක්‍රියාකාරකම්**

1. **ඕන්ස් කැට නවය බැගින් කණ්ඩායම් වලට ගුරුවරයා පවසන සංඛ්‍යාවට ගැළපෙන ඕන්ස් කැට ඉවත් කිරීම. ඕන්ස් කැට පහක් ඉවත් කර ඉතිරිය පෙන්වීම. (ගුරුවරයා කණ්ඩායම් වලට ගොස් පිළිතුර නිරීක්ෂණය කිරීම) නැවතත් ඕන්ස් කැට නවය සාද එයින් එකක් ඉවත් කර දෙන ලද පත්‍රිකාවේ සඳහන් සංඛ්‍යාව කපා ඉවත් කිරීමට දීම.**

2. **දෙන ලද පත්‍රිකාවේ සඳහන් සංඛ්‍යාව කපා ඉවත් කිරීමෙන් ඉතිරිය ප්‍රකාශ කිරීම.**



9 - 5 =



8 - 1=

3. **දෙන ලද අඩු කිරීමේ ගැටලුවට පිළිතුරු ලිවීම.**

| | |
|---|---|
| 5<br>- 3<br>═══ | 9<br>- 5<br>═══ |
| 8<br>- 4<br>═══ | 4<br>- 2<br>═══ |

**ඇගැයීම හා තක්සේරුව**

1. **පහත සඳහන් රූප පත්‍රිකාව මගින් ගැටලු විසඳීම. පහෙන් තුනක් අඩුකර පිළිතුරු ලියන්න.** (**රූප තුනක් පාට කරන්න**)



5 - 3=

2. **යා කරන්න**

| | |
|---|---|
| **5 - 3** | **2** |
| **4 - 1** | **7** |
| **9 - 2** | **1** |
| **7 - 5** | **3** |

3. **ගැටලු විසඳන්න.**

| | | |
|---|---|---|
| 9<br>- 4<br>═══ | 6<br>- 3<br>═══ | 4<br>- 3<br>═══ |

**ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය**

තනිව ඉගෙන ගන්නා කණ්ඩායම

A. **හිස්තැන් පුරවන්න**

1. 5 - .................... = 2
2. 9 - .................... = 7
3. 6 - 3 = ....................
4. 8 - .................... = 8

යහළුවන්ගේ සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම

B.**කාඩ්පත් මගින් පිළිතුරු සෙවීම.**

1 **2** – 1 = ------------------

2 3 – 2 = ----------------


**3** 4 – 2 = ------------------


4 5 – 4 = ----------------

5 6 – 3 = ------------

ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

C.**රූප කාඩ් මගින් පිළිතුර සෙවීම.**




ගුරුවරයාගේ සහය සම්පුර්ණයෙන් අවශ්‍ය කණ්ඩායම

D. **ඕන්ස් කැට මගින් ගැටලු ගුරුවරයා විසින් නැවත හඳුන්වාදී ගැටලු විසඳීම.**

1. **තුනෙන් දෙකක් අඩු කිරීම**
2. **තුනෙන් එකක් අඩු කිරීම**
3. **හතරෙන් දෙකක් අඩු කිරීම**

01. **දිනය** - තුනවන වාරය 1 සතිය 2 දවස

02. **ශ්‍රේණිය** - **4**

**03' විෂය** - **මව්බස**

**04' කාලය** - **මිනිත්තු** 60

**05' ක්ෂේත්‍රය** - W

**06' නිපුණතාවය** - $W_{10}$ **සම්මත භාෂා ව්‍යවහාර සහ භාෂා අභ්‍යාස සඳහා ලියයි**

**07' ඉගෙනුම් පල** - **ලිඛිත ව්‍යවහාර පිළිබඳ අවබෝධයෙන් යුතුව නිවැරදිව භාෂා අභ්‍යාසයෙහි යෙදෙයි**

**08' ඉගෙනුම් පල** - **නාම පද හදුනාගනියි'**

**නාම පද වර්ග කරයි'**

**නාම පද ලියා දක්වයි'**

**09' පාඩම** - **නාම පද**

**10' ඉ සම්පත්** - **නාම පද සහිත රූප වගුවක් නාම පද සහිත වචන නාම පද යෙදුණ වැකි**

**11' ඉ .ඉ ක්‍රමවේදය** - **කණ්ඩායම් හා කේවල**

**12. හඳුන්වා දීමේ ක්‍රියාකාරකම් -**

**1 ගීතයක් ඇසුරින්**

**වට්ටියකට මල් නෙලා**
**මාලා කමලා එක් වෙලා**
**සුදු ඇදුමින් සැරසිලා**
**යයි පන්සල වෙත බලා**

**පාර දිගේ යන කලා**
**බූලා දුවගෙන එනා**
**නංගි මගේ අඬ අඬා**

**2' භූමිකා රංගනයක් මගින්**

**(හිඟන්නෙකුගේ භූමිකාවක් රඟ දක්වමින් අත ඇති මල්ල බිම දැමීම) මල්ලෙහි ඇති ද්‍රව්‍ය පෙන්වමින් ද්‍රව්‍ය නාම සහ සතත්ව නාම ස්ථාන නාම හා පුද්ගල නාම හඳුන්වා දීම.**
**( මල්ලට ද්‍රව්‍ය /සත්ව ආකෘති දැමීම)**


3' පියවර

පෙට්ටියෙහි ඇති  කාඩ්පත් ඇසුරෙන් පුද්ගල නාම / ස්ථාන නාම /ද්‍රව්‍ය නාම සහ සත්ත්ව නාම හඳුන්වා දීම. ( නාමය අනුව වර්ග කර හුණු පුවරුවේ දැක්වීම)

13' භාවිත ක්‍රියාකාරකම්

පියවර 01.

දෙන ලද නාම පද වර්ගවල රූප වෙන් කර කියවීම'(  මල සමනලයා ළිඳ ළමයා )









පියවර 02.

නාම පද ලියූ කාඩ්පත් වර්ග කර දැක්වීම. (ඩිමයි කොළයක පහත වගුව ඇඳ ලබා දීම.)

| පුද්ගල | සත්ත්ව | ද්‍රව්‍ය | ස්ථාන |
|---|---|---|---|
| | | | |

පියවර 03.

කට්ට පුවරුවේ දෙන ලද නාම පද වර්ග කර දැක්වීම.

පාසල, විදුහල්පතිතුමා, රෝහල, ගෙදර, මහරගම, ඉඩම, බිනුරි, පසිඳු, මාමා, පැන්සල , ගස්ලබු, ළිප, බන්දේසිය, උණකටුව, අල්මාරිය, තාරාවා, බත්කූරා, ඉස්සා, ගිරවා

14' ඇගැයීම හා තක්සේරුව

පියවර 01.


පහත වගුවෙහි අදාළ නාම පදයෙහි හරි ලකුණු යොදන්න.

| | පුද්ගල නාම | සත්ත්ව නාම | ද්‍රව්‍ය නාම | ස්ථාන නාම |
|---|---|---|---|---|
| ගිරවා | | | | |
| බල්ලා | | | | |
| පොත | | | | |
| කඩය | | | | |
| නැන්දා | | | | |

පියවර 02.

දෙන ලද නාම පද අදාළ වර්ග අනුව වගුගත කර ලිවීම.

තාත්තා, පෑන, ගිණිකූර, නාවලපිටිය, මනුරි, පින්සල , තාරාවා, හෙදිය, කුඹුර, පාසල



පියවර 03.

**ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 109 පිටුවේ ඇති අපේ ගෙදර.... ඡේදය ඇසුරින් නාම පද වගුගත කිරීම.**

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |

**ඉදිරි පෝෂණය හා ප්‍රතිකාරය ( ගතික කණ්ඩායම් වලට වෙන්කිරීම)**

තනිව ඉගෙනගන්නා කණ්ඩායම

A. **කතන්දරයක් කියවා එහි ඇති නාම පදය නාම පද වර්ග කර දැක්වීම**
**නිමලුයි කමලුයි කැත්තක් අරගෙන කැලේට යනකොට හාවෙක් පැන පැන ආවා. එයාලා දැකපු හාවා වැව ළගට ගියා. වැවේ හිටපු මාළු බයවෙලා නෙළුම් කොළය යට සැඟවුණා.**

**යහළුවන්ගේ සහයෝගයෙන් ඉගෙනගන්නා** කණ්ඩායම

B' වැකිවල ඇති නාම පද තෝරා වර්ග කර ලිවීම

1. **මාමා බසයට නැග මාතර ගියේය.**
2. **අමල් බෑගයට පොත් දමා වැසුවේය.**
3. **කමලානී පූසාට කිරි කෝප්පයක් දුන්නාය.**

C' **දෙන ලද නාම පද පත්‍රිකා වර්ග කර බලා ලිවීම**

ගු**රුවරයාගේ මදක් සහය අවශ්‍ය කණ්ඩායම**

D' **රූපයක් බලා එහි ඇති නාම පද සෙවීම**

**ගුරුවරයාගේ සම්පූර්ණ සහය අවශ්‍ය කණ්ඩායම**

ගුරුවරයා විසින් පහත රූපය භාවිත කර එහි ඇති නාම පද සිසුන්ට හඳුන්වාදී රූපය මත නාමපද වෙන්කර පෙන්වීම.



**15' සාරාංශය-**

**නාමපද නැවත මතක් කර පවසන ලද පදයට අදාළ නාම පද වර්ගය පහදාදීම'**

02. **දිනය** - **දෙවන වාරය 5 වන සතිය** 1 දවස

03. **ශ්‍රේණිය** - **4**

04. **විෂයය** - **ගණිතය**

05. **කාලය** - **මිනිත්තු 60**

06. **ඒකකය** - **කාලය** I

07. **නිපුණතාවය** - **මිනිත්තු පැය දවස් සති හා මාස අතර සම්බන්ධතාවය හඳුනාගෙන භාවිතා කරයි'**

08. **ඉගෙනුම්** පල - **සතියේ දවස් හඳුනාගනියි'**
- **දවස් වල නම් නිවැරදි ව කියයි'**
- **දවස් වල පෙර හා පසු දවස් වල නම් නිවැරදිව ලියයි'**

09. **පාඩම** - **සතියේ දවස් හඳුන්වා දීම'**

10. **ඉගෙනුම් සම්පත්** - **සතියේ නම් ලියූ මාල, රූප කාඩ්පත්, දවස්වල නම් ලියූ කාඩ්පත්, ඇඳින ලද ඉංගිමගක්, මලක ආකෘතියක්**

11. **ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කණ්ඩායම්, කේවල**

12. **මනෝමය ගණිතය**

**කඩයකින් පිල් බෝල අටක් ගත්තා. ගෙදර ගිහින් බලනකොට බෑගයේ ඉතුරු වී තිබුණේ පිල් බෝල 5ක් විතරයි. අයියෝ...... ඉතුරු ටික මග වැටිලා. කීයක් මග වැටිල ද දන්නේ නැහැ. කියක්ද කියලා හොයලා දෙන්න පුළුවන්ද**?

13. **හඳුන්වාදීම** -

**01.** පියවර කතන්දරයක් මගින්

**නිමල් සතියේ පළමු දවස වුණු සඳුදා සතුටින් පාසල් ගොස් නිවසට ආවා. අනේ පසු දින අඟහරුවාදා හිතුවේවත් නැති විදිහට නිමල් අසනීප වුණා. බදාදා එයාට හොඳටම අමාරුයි. බෙහෙත් ගන්න රෝහලට ගියා. බ්‍රහස්පතින්දා එයා ඇඳට වෙලාම විවේක ගත්තා. සිකුරාදා එයාලගේ ක්‍රීඩා උත්සවය. සෙනසුරාද අම්මත් එක්ක එයා පොළට ගිය. ඉරිදා දහම් පාසල් ගියා. එයා ගෙවුණු සතිය ගැන ඉරිදා රෑ බොහෝ වේලාවක් කල්පනා කරමින් ඉන්නකොට දන්නෙම නැතුව එයාට නින්ද ගියා.**

**02.** **ගීතය ගයමින් පින්තූර ඇසුරින් සතියේ දවස්වල නම් හඳුන්වා දීම.**

**සඳුදා දවසේ පන් උදුරනවා** **අඟහරුවාදා ගෙදර ගේනවා**


**බදාදා දවසේ පන් වේලෙනවා** **බ්‍රහස්පතින්දා පැදුර පූරනවා**

**සිකුරාදා මම පැදුර වියනවා** **සෙනසුරාදට මම තීන්ත පොවනවා**

**ඉරිදා දවසේ පොළට ගේනවා**

| | | | | |
|---|---|---|---|---|
| **පන් උදුරන රූපයක්** | **පන් වේලන රූපයක්** | **පැදුරු වියන රූපයක්** | **පැදුරට තීන්ත පොවන රූපයක්** | **පැදුරු ගෙන යන රූපයක්** |

**03' ගීතයක් මඟින්**





**ඉහත ආකාරයේ සතයේ දිනවල නම් ලියූ මාල පැළඳගෙන පහත ගීතය ගායනා කරමින් වරකට සිසුන් තිදෙනා බැගින් ඉදිරියට ගෙන පළඳා සතියේ දවස්වල පෙර හා පසු දවස් හඳුන්වා දීම.**





**මාල මාල මාල - හරි ලස්සන මාල**
**කවුද ගන්නේ මාල - හරි ලාබයි මාල**

14. **භාවිත ක්‍රියාකාරකම්**

**01. සතියේ දිනවල නම් අනුපිළිවෙලින් ඉණිමඟක් මත රැඳවීම.**




**02. මල් පෙති මත ඇති හිස්තැන්වලට අදාළ දවස කාඩ්පත්වලින් තෝරා තැබීම.**



**03.** අහඹු ලෙස තෝරාගත් දවසට අදාළ පෙර හා පසු දවස්වල නම් ලියූ කාඩ්පත් සොයා තැබීමට දීම.

........................................ **බදාදා** ........................................

**(කණ්ඩායම් සියල්ලටම දවස්වල නම් යෙදූ කාඩ්පත් ලබා දීම)**

15. **ඇගැයීම් හා තක්සේරුව**

**01.** සතයේ දිනවල නම් ප්‍රකාශ කිරීමට හා ලිවීමට දීම.

**02.** හිස්තැනට අදාළ දවස්වල නම් ලිවීමට දීම'

**...................අඟහරුවාදා................... බ්‍රහස්පතින්දා ...................සෙනසුරාදා**

**03.** දෙන ලද දවසට අදාළ පෙර හා පසු දවස් ලිවීමට දීම'

**...................සිකුරාදා ...................**

**...................අඟහරුවා ...................**

16. **ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්ය ( ගතික කණ්ඩායම් වෙන් කිරීම)**

තනිව ඉගෙනගන්නා කණ්ඩායම

A. **සතියේ දවස්වල නම් අනුපිළිවෙළින් ලියා ඔබ කරන ක්‍රියාකාරකම් ඇඳ ලියා දක්වන්න.**

යහළුවන්ගේ සහයෙන් ඉගෙන ගන්නා කණ්ඩායම

B. **සතියේ දවස් ලියූ කාඩ්පත් ලබා දී හිස්තැනට අදාළ දවස තැබීමට දීම'**

| පෙර දවස | දවස | පසු දවස |
|---|---|---|
| | අඟහරුවාදා | |
| | සිකුරාදා | |
| | සඳුදා | |
| | බදාදා | |
| | සෙනසුරාදා | |
| | ඉරිදා | |
| | බ්‍රහස්පතින්දා | |

C. ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

**සතියේ දවස්වල නම් අනුපිළිවෙලට තැබීම හා අනුපිළිවෙලට ලිවීම.**

**……………….අඟහරුවා……………….බ්‍රහස්පතින්දා……………….සෙනසුරාදා ……………….**

ගුරුවරයාගේ සහය වැඩිපුර අවශ්‍ය කණ්ඩායම

D. **සතියේ දවස්වල නම් ලියූ කාඩ්පත් ලබා දී** ගුරුවරයා **සමඟ සතියේ දවස් කියවමින් අනුපිළිවෙලට තැබීම '**

**සාරාංශය**

**සතියේ දවස් නැවත මතක් කරීම'**

01. **දිනය** - පලමු වාරය 5 සතිය 1 දවස

02. **ශ්‍රේණිය** - **4**

03. **විෂය** - **ගණිතය**

04. **කාලය** - **මිනිත්තු 60යි**

05. **ඒකකය** - **සංඛ්‍යා රටා**

06. **නිපුනතාවය** - **සංඛ්‍යා රටා ගොඩනගයි**

07. **ඉගෙනුම් පල** - **පොදු අන්තර්ගත 2 ක් වූ සංඛ්‍යා රටාව ගොඩනගයි'**

08. **අතුරු ඉගෙනුම් පල** - **පොදු අන්තර්ගත 2 ක් වූ සංඛ්‍යා රටා කියවයි'**

- **පොදු අන්තර්ගත 2 ක් වූ සංඛ්‍යා රටා ද්‍රව්‍ය ඇසුරෙන් රටා ගොඩනගයි'**

- **පොදු අන්තර්ගත 2 ක් වූ සංඛ්‍යා රටා සංඛ්‍යා ඇසුරෙන් ගොඩනගා ලියයි'**

09. **පාඩම** - **පොදු අන්තර්ගත 2 වූ සංඛ්‍යා රටා හඳුන්වාදීම'**

10. **ඉගෙනුම් ඉගැන්වීම් සම්පත්** -

- **අයිස් ක්‍රීම් කෝන් (නිර්මාණය කරන ලද)**
- **සංඛ්‍යාංක කාඩ්පත්**
- **ගල් කැට**

11. **ඉගෙනුම් ඉගැන්වීම්** -

- **කණ්ඩායම් ක්‍රමය**
- **කේවල ක්‍රමය**

12. **මනෝමය ගණිතය** - **2 ට 2ක් එකතු කළ විට පිළිතුර කීයද?**
**12 ට 2ක් එකතු කළ විට පිළිතුර කීයද?**
**65 ට 2ක් එකතු කළ විට පිළිතුර කීයද?**

13. **හඳුන්වා දීම**

**1 (ගීතයක් ඇසුරින්**
**දෙකෙන් දෙකට ගණන් කරමු**
**දෙකෙන් දෙකට ද්‍රව්‍ය තියමු**
**දෙක හතර හය කියලා**
**අංක අලවමු**

ලෙස ගයමින් 1-10 තෙක් සංඛ්‍යා ලියූ සංඛ්‍යා පත් පිළිවෙළට තබා ප්‍රදර්ශන පුවරුවේ රඳවා 2,4,6,8,10 යන සංඛ්‍යාපත් වෙනම පෙළකට ඇලවීම' ඉන් පසු ගුරුවරයා සංඛ්‍යාව ශබ්ද කර කියවීම.

උදාහරණ

| | | | | |
|---|---|---|---|---|
| 1 | 3 | 5 | 7 | 9 |
| 2 | 4 | 6 | 8 | 10 |

ඉහත පේළි දෙකෙහි සංඛ්‍යා අතර පොදු අන්තරය දෙක බව පහදා දීම'

11,13,15,17... සංඛ්‍යා රටාව කළු ලෑල්ලේ ලියා රටාව පිරවීම

2 කතන්දරයක් මගින්

- මගේ ළඟ බෝල 3ක් තිබුණා' තාත්තා අලුතින් වෙන 2ක් ගෙනාවා' දැන් මගේ ළඟ බෝල 5යි. අම්මා තව බෝල 2ක් ගෙනාවා දැන් බෝල 7 යි' ලෙස කියමින් ගොඩනැගූ සංඛ්‍යා රටාව ප්‍රදර්ශනය කිරීම 3 , 5 , 7 සංඛ්‍යා දෙකක් අතර වෙනස 2 ක් බව පෙන්වාදීම'

3 පියවර

11,13,15,17... සංඛ්‍යා රටාව කළු ලෑල්ලේ ලියා රටාව පිරවීම'

14 භාවිත ක්‍රියාකාරකම්

1 -පියවර - 30-50 තෙක් කාඩ්පත් දී පොදු අන්තරය සහිත සංඛ්‍යා රටා ගොඩනැගීමට උපදෙස් ලබා දීම'

2 පියවර - සිසු කණ්ඩායම්වලට සංඛ්‍යාංක කාඩ්පත් ලබාදී පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටාවක් ගොඩනැගීමට උපදෙස් ලබා දීම'

3 පියවර - ඕමයි කොළයක පහත සඳහන් ආකාරයට ලියා දී පොදු අන්තරය 2 වන සංඛ්‍යා රටාවකට නොගැළපෙන සංඛ්‍යා තෝරා රවුම් කිරීමට සැලැස්වීම,

උදාහරණ

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 7 | 8 | 9 | 11 | 12 |
| 10 | 12 | ~~13~~ | 14 | 16 | ~~17~~ |

4 පියවර

දෙන ලද පත්‍රිකාවේ කණ්ඩායම් එක්ව ගොඩ නගන ලද සංඛ්‍යා රටා ලිවීමට සැලැස්වීම'

**15 ඇගැයීම් හා තක්සේරුව - ගතික** කණ්ඩායම් වෙන් කිරීම'

**1 පියවර**

**සිසුන් පෙළට සිටුවා ගුරුතුමිය පේළියේ පළමු සිසුවා ලබාදෙන සංඛ්‍යාවේ සිට ඉදිරියට 2න් 2කට ගනිමින් පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටාවක් ඉදිරියට ගොඩනැගීම'**

**2 පියවර**

**ලබාදෙන සංඛ්‍යා රටාවල හිස්තැන් පුරවා සංඛ්‍යා රටාව සම්පූර්ණ කරන්න'**

**උදාහරණ**

20, 22, 24, ......., ......, 30,...... , ...........

3 **පියවර**

**සංඛ්‍යා ලබා දී එම සංඛ්‍යාවේ සිට ඉදිරියට පොදු අන්තරය දෙක වූ සංඛ්‍යා රටා ගොඩනැගීම' (සංඛ්‍යා පහක් ඉදිරියට)**

**උදාහර** 35 ........... ........... ........... ...........

**ඉදිරි පෝෂණය ප්‍රතිකාර්ය**

**තනිව ඉගෙන ගන්නා කණ්ඩායම**

A. ගණිතය වැඩ පොත් අභ්‍යාස කිරීම'

**යහළුවන්ගේ උදවු ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

B. ගුරුතුමිය සපයන පැවරුම් වල සංඛ්‍යා රටාවල හිස්තැන් පිරවීම'


**ගුරුතුමියගේ මදක් සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

C. ගුරු සහය ඇතිව ලබා දෙන පැවරුම්පත සම්පූර්ණ කිරීම

**ගුරුතුමියගේ සම්පූර්ණ සහය ඇතිව ඉගෙන ගන්නා කණ්ඩායම**

D. ද්‍රව්‍ය ඇසුරින් පොදු අන්තරය දෙක වූ සංඛ්‍යා රටාවක් ගොඩනැගීම (ගල්කැට ඇසුරෙන්

උදාහරණ




සාරාංශය -පොදු අන්තරය 2 ක් වූ සංඛ්‍යා රටාවක් ගොඩනැගෙන ආකාර උදාහරණ සහිතව කියමින් නැවත මතක් කිරීම'

**01 දිනය :-** තුන්වන වාරය 1 සතිය 3 දිනය

**02 විෂය :- මව්බස**

**03 ශ්‍රේණිය :- 4**

**04 කාලය :- මි 60**

**05 ෂේත්‍රය :-** W

**06 නිපුණතාව :- සම්මත භාෂා ව්‍යවහාර සහ භාෂා අභ්‍යාස සඳහා ලියයි.**

**07 ඉගෙනුම්** පලය **:- ලිඛිත ව්‍යවහාරය පිළිබඳ අවබෝධයෙන් යුතුව, නිවරදිව අවබෝධයෙන් යුතුව, නිවැරදිව** හදුනා ගනීයි**.**

**නාම පද හදුනාගනියි**

**නාම පද හදුනාගෙන ලියයි**

**නාම පද භාවිත කරයි.**

08 පාඩම නාමපද හදුනාගෙන භාවිත කිරීම

**08 ඉගෙනුම් සම්පත් :- වචන කාඩ් ,පිංතුර කාඩ් ,පත්‍රිකා**

**09 ඉගෙනුම් /ඉගැන්වීම් ක්‍රමවේදය :- කේවල් / කණ්ඩායම්**

**10 හඳුන්වා දීමේ පියවර 01 : අද අපේ පන්තියට අමුත්තෙක් එනවා යැයි පවසමින් ගොවි මහතෙකු ලෙස කරුණු දරුවෙකු පන්තිය ඉදිරියට කැදවා පහත ගීතය ගායනා කිරීම**

**උදෑසනින් අවදි වෙලා උදැල්ලකුත් කරේ තබා කුඹුර බලා ගමන් කරන - ගොවිරාළයි මං**

**ඉහත කවිය ලියු පත්‍රිකාව කළු ලෑල්ලේ ප්‍රදර්ශනය කර නාම පද පිළිතුර ලෙස ගැනෙන ප්‍රශ්න ලෙස ඉදිරිපත් කරමින් ගුරුතුමියම පිළිතුරු දෙමින් නාම පද හදුන්වා දීම.**

**කවුද මේ උදෙන්ම කුඹුරට යන්නේ කොහෙටද ? කුඹුරට ගොවියා අතේ තියෙන්නේ මොකක්ද ? උදැල්ල ඒ ඇසුරින් පුද්ගල නාම , ස්ථාන නාම හා ද්‍රව්‍ය නාම හඳුන්වා දීම.**

**පියවර 02 :- කතන්දරයක් ඇසුරින් නාම පද හදුන්වා දීම දවසක් ඉබ්නයිදේ ගමනක් යන්න ගෙදරින් පිටත් වුණා .දෙන්නාම ගොඩක් දුර ඇවිද ගියා. මහන්සියට ගල්ගුහාවක් ළග නතර වුණා දන්නෙම නැතුව දෙන්නට නින්ද ගියා ටික වේලාවකින් හා හාමිට ඇහැරුණා ඉබි නයිදේ හොඳටම නිදි හා හාමිට හොඳටම තිබහයි. වතුර ටිකක් හොයා ගන්න ඕනේ. හා හාමි විලක් දැක්කා එයා එ විලෙන් ඇති තරම් වතුර බීවා .**

**කතන්දරය ඉදිරිපත් කරන අතර පහත වචන ලියු කාඩ් පත් කළු ලෑල්ලේ ප්‍රදර්ශනය කිරිම.**

| ඉබ්බා | හාවා | ගෙදර | ගල් ගුහාව |
| --- | --- | --- | --- |

| | | | | |
|---|---|---|---|---|
| විල | වතුර | කොළය | ගොට්ට | යාළුවෝ |

කට්ටා පුවරුව ආධාරයෙන් ඉහත නාම පද වර්ග කොට දැක්වීම.

පියවර 3 :- නාම පද ලියු කාඩ්පත් පෙට්ටියකට දමා අහඹු ලෙස ගන්නා කාඩ්පත් අයත් නාම පද වර්ගය අනුව පුවරුවේ රඳවමින් නාම පදවර්ග කර හඳුන්වා දීම.

11 භාවිත ක්‍රියාකාරකම් :-

පියවර 1 :- සිසුන් කණ්ඩායම්වලට පහත දැක්වෙන නාම පද ලියු පත්‍රිකා සහ පැවරුම්පත ලබා දී නාම පද අදාළ තිරුවේ ඇලවීම.

| | | | |
|---|---|---|---|
| විල | ගල | වදුරා | ගෙදර |
| කොට්ටය | පාසල | සිරිමල් | ගම |
| ගිරවා | පොත | පෑන | ගුරුවරයා |

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

පියවර 2 :- සිසු කණ්ඩායම්වලට නාමපද වර්ග අනුව එක් එක් කණ්ඩායම නාම පද අනුව වෙන් කිරිම .ගුරුතුමිය නාම පදයක් ප්‍රකාශ කර එය අයත් කණ්ඩායම නාම පද වර්ගයක් අනුව වෙන් කිරිම ගුරුතුමිය නාම පදයක් ප්‍රකාශ කර එය අයත් කණ්ඩායම නැගිටිම

උදා :- ගුරුතුමි අම්මා කියු විට පුද්ගල නාම යටතේ සිටින කණ්ඩායම නැගිටිම.

පියවර 3:- පහත වගුව පන්ති කාමරයේ ප්‍රදර්ශනය කර ඡේදයේ පිටපත බැගින් සිසුන්ට බෙදා දීම (ගුරු අත්පොත අපේ ගෙදර ඡේදය ) ඉහත පියවර දෙකෙහි කණ්ඩායමට අයත් නාම පද ඡේදයෙන් තොරා කඩදාසි තීරුවල කඩදාසි තීරුවල ලිවීම .ඒවා ප්‍රදර්ශනය කර ඇති වගුවේ ඇලවීම.

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ව නාම |
|---|---|---|---|
| | | | |
| | | | |

12 ඇගයීම් ක්‍රියාකාරකම:-

පියවර 1 :- යා කරන්න

ආලින්දය පුද්ගල නාම

අත්තම්මා ස්ථාන නාම

බට්ටිච්චා ද්‍රව්‍ය නාම

කේතලය සත්ත්ව නාම

පියවර 2 :- අදාළ නාම පදය ඉදිරියෙන් හරි ලකුණ යොදන්න

| නාම පදය | ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | සත්ත්ව නාම | ස්ථාන නාම |
|---|---|---|---|---|
| කුස්සිය | | | | |
| වලහා | | | | |
| බේසම | | | | |
| ගුරුතුමා | | | | |

පියවර 3 :- නාම පද අඩංගු පහත ඡේදය සිසුන්ට වගුව සම්පූර්ණ කිරිම.

තරිඳු නිවසේ සිට පාසලට ගියේ බයිසිකලයක දවසක් තරිඳු පුසාට කෑම දාලා පාසල් යන්න බයිසිකලයට නැග්ගා බයිසිකලයේ රෝදයක් හලං බැහැලා . තරිඳු අම්මාට කතා කළා .අම්මා තරිඳුගේ කෑගැහිල්ලට මිදුලට දුවගෙන ආවා අම්මාගේ අතේ හැන්දක් තරිඳුට හිනා මොකද පුතේ කෑ ගහන්නේ අම්මා ඇහුවා මගේ බයිසිකලේ හුලං ගිහිල්ලා මම ඉස්කෝලේ යන්නේ කොහොමද පොත් බෑගය එල්ලගෙනම තරිඳු අඬනවා ඉන්න මම තාතතට කතා කරන්න අද ඔයා තාත්තා එක්ක ඉස්කොලේ යන්න කියමින් අම්මා සාලයට ගියා.

**(ජේදයේ සඳහන් නාම පද හදුනාගෙන පහත වගුවේ අදාළ නාම පද ලිවීම )**

| | |
|---|---|
| **ද්‍රව්‍ය නාම** | |
| **පුද්ගල නාම** | |
| **ස්ථාන නාම** | |
| **සත්ත්ව නාම** | |

**ඉදිරිපෝෂණය** හා **ප්‍රතිකාර්ය**

තනිව ඉගෙනගන්නා කණ්ඩායම

A **දාදු කැටයක පැතිවල නාම වර්ගය ලියා , දාදු කැටය** උඩ **දමා ලැබෙන නාම පද වර්ගයට අදාළ නාම පදයක් ලිවීම . වැකියක් ගොඩ නගා ලිවීම.**

| **ද්‍රව්‍ය නාම** | **පුද්ගල නාම** | **ස්ථාන නාම** | **සත්ත්ව නාම** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

යහළුවන් සමග ඉගෙන ගන්නා කණ්ඩායම

**ගැළපෙන නාම පද වර්ගය තෝරා යා කරන්න.**

| | |
|---|---|
| **කොටියා** | |
| **පැන්සල** | ස්ථාන **නාම** |
| **ගාල්ල** | සත්ත්ව **නාම** |
| **කමලා** | |
| **ගුරුතුමී** | පුද්ගල **නාම** |
| **අලියා** | **ද්‍රව්‍ය නාම** |

ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම

දෙනලද රූප කාඩ් නාමපද වර්ග අනුව වෙන්කර කියවයි

ගුරුවරයාගේ සම්පූර්ණ සහය අවශ්‍ය කණ්ඩායම

ගුරුවරයා විසින් කාඩ්පත් භාවිත කර නැවත නාම පද හඳුන්වා දී කාඩ් පත්වල ඇති රූප නාම පද වර්ග අනුව වෙන් කිරීම.

**දිනය** - තුන්වන වාරය 1 සතිය 3 දවස

**ශ්‍රේණිය - 4**

**විෂය - ගණිතය**

**කාලය - මිනිත්තු හැටයි**

**ඒකකය - සංඛ්‍යා**

**නිපුණතාව - සංඛ්‍යා හඳුනාගෙන භාවිත කරයි.**

**ඉගෙනුම් පල - 9999 තෙක් කවර හෝ සංඛ්‍යාංකයක් හා සංඛ්‍යා නාමයක් කියවයි ලියයි**

**අතුරු ඉගෙනුම් පල -**

1. **99 තෙක් දෙකේ සංඛ්‍යා හඳුනාගෙන කියවයි**
2. **999 තෙක් සංඛ්‍යා හඳුනාගෙන කියවයි**
3. **9999 තෙක් සංඛ්‍යාවල සංඛ්‍යා නාමය කියවයි**
4. **9999 තෙක් සංඛ්‍යා නාමයට අදාළ සංඛ්‍යාංකය හදයි**

**පාඩම - 9999 තෙක් සංඛ්‍යා කියවීම හා ලිවීම**

**ඉගෙනුම් සම්පත් -ප්‍රදර්ශන පුවරු / බැලුන් / කාඩ්පත් / කාඩ්බෝඩ් පෙට්ටියක්**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවල/ කණ්ඩායම්**

**මනෝමය ගණිතය -**


1. **2 සහ 7 ඉලක්කම් දෙකෙන් සෑදෙන සංඛ්‍යාව කීයද**?
2. **27 සංඛ්‍යාවේ 10 ඒවා කීයද**?
3. **125 සංඛ්‍යාවේ එකස්ථානයේ පිහිටි ඉලක්කම කීයද**?

**හඳුන්වාදීමේ ක්‍රියාකාරකම් -**


1. **කතන්දරයක් මගින්**

**සුනිමල්ගේ ආච්චි ජීවත් වුණේ කොළඹ. ආච්චි දවසක් දුව බලන්න මාතර යන්න කොළඹ කොටුව බස් නැවතුමට ආවා. බස් නැවතුමේ බස් පේළියට නවත්වලා තිබුණා. ආච්චි බස් අංක 262, 375, 705, 1805 කියවමින් ඉදිරියට යනකොට 1796 මාතර බස් එක හමුවුණා. ආච්චි සතුටින් මාතර ගියා.**


2. **චිත්‍රයක් මගින්**
**දුම්රියක එක් එක් පෙට්ටිවල සිටින මගීන් ගණන ප්‍රදර්ශනය කර කියවීම.**





3. **බැලුන් දහයක ඉලක්කම් 0 සිට 9 තෙක් ලියා අහඹු ලෙස බැලුන් හතරක් ගෙන එහි ඇති ඉලක්කම්වලින් සෑදෙන ඉලක්කම් හතරේ සංඛ්‍යාංකයක් කියවීම.**




**5739**





**4102**




**3967**

**භාවිත ක්‍රියාකාරකම්**

1. **1-9 තෙක් ලියූ සංඛ්‍යා කාඩ්පත් පෙට්ටියකට දමා එක් සිසුවෙකුට ඉලක්කම් එක බැගින් ගෙන ඉලක්කම් හතරක් සංඛ්‍යාව සාදා කියවීම. (කණ්ඩායම් හතරකට සිටි)**



**ඉලක්කම් අලවමින් සංඛ්‍යා කියවීම.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 | 1 | 3 | 5 | 5 | 2 | 3 | 1 |

2. **මෙලෙස 0-9 තෙක් ඉලක්කම් හතර බැගින් ගෙන අලවා සංඛ්‍යාව කියවීම. මෙවැනි සංඛ්‍යා හතරක් කාඩ්පතක් අලවා සංඛ්‍යාව කියවීම.**

3. **සංඛ්‍යාව හා සංඛ්‍යා නාමය කාඩ්පත්වල ලියා ඒවා මිශ්‍ර කර ලබා දී සංඛ්‍යාංකයට ගැළපෙන සංඛ්‍යා නාමය ගැළපීමට දීම.**

**උදාහරණ - 1925 එක් දහස් නවසිය විසි පහ**

**ඇගයීම් හා තක්සේරුව**


1. **දෙන ලද සංඛ්‍යාංකයේ සංඛ්‍යා නාමය කියවීම.**
   **98**
   **272**
   **811**
   **2480**
   **700**

2. **සංඛ්‍යා නාමයට ගැළපෙන සංඛ්‍යාංකය සෙවීම.**
   **උදාහරණ - එක්දහස් නවසිය තිහ**

   **ඉදිරි පෝෂණය හා ප්‍රතිකාර්යය - ගතික කණ්ඩායම් වෙන් කිරීම**

   - **තනිව වැඩ කරනා සිසුන් සඳහා තරුවේ ඇති ඉලක්කම් හතරක් භාවිතා කර කැමති සංඛ්‍යා 5ක් සකස්කර එහි සංඛ්‍යා නාමය ලිවීම**
   - **සංඛ්‍යා නාමය ලබාදී එයට ගැළපෙන සංඛ්‍යාව සංඛ්‍යාපත් ඇසුරෙන් සාදා කියවීමට දීම**

A.



**මිතුරු මිතුරියන්ගේ සහයෝගයෙන් ඉගෙනගන්නා කණ්ඩායම**

B. **සංඛ්‍යාංකයට ගැළපෙන සංඛ්‍යා නාමය ගැළපීමේ පැවරුම්පතක් ලබා දී යා කිරීමට දීම**

| | |
|---|---|
| **2379** | **අට දහස් පන්සිය හැට අට** |
| **4158** | **දෙදහස් තුන්සිය හැත්තෑව** |
| **2678** | **හතරදහස් පන්සිය අට** |
| **8568** | **දෙදාස් හයසිය හැත්තට** |

**ගුරුවරයාගේ සහය මදක් අවශ්‍ය කණ්ඩායම**

C. **1-6 දක්වා ඉලක්කම් ලියූ දාදු කැටයක් හතර වරක් උඩ දමා ලැබෙන ඉලක්කම් කාඩ්පත් වලින් නිරූපණය කර සංඛ්‍යාව කියවීමට යොමු කිරීම.**

**ගුරුවරයාගේ සහය සම්පූර්ණයෙන්ම අවශ්‍ය කණ්ඩායම**

D. **ගුරුවරයා සිසුන් ළඟට ගොස් ඉලක්කම් හතර සංඛ්‍යා සාදා ගුරුවරයා කියවූ විට සංඛ්‍යා නාමය කියවීම.**

**දිනය -** දෙවන වාරය 3 සතිය

**ශ්‍රේණිය - 4 ශ්‍රේණිය**

**විෂය - මව්බස**

**කාලය - මිනිත්තු 60**

**ක්ෂේත්‍රය -** LSRW

**නිපුණතාවය -**

- **වාග්මාලා සංවර්ධනය සඳහා සවන් දෙයි**
- **වාග්මාලා සංවර්ධනය සඳහා කතාකරයි**
- **වාග්මාලා සංවර්ධනය සඳහා කියවයි**
- **වාග්මාලා සංවර්ධනය සඳහා ලියයි**

**ඉගෙනුම් පල - වාග්මාලා පෝෂණය සඳහා සමානාර්ථ පද භාවිත කරයි.**

- **සමානාර්ථ පද හඳුනාගනියි**
- **සමානාර්ථ පද කියවයි**
- **සමානාර්ථ පද ලියයි**

**පාඩම - සමානාර්ථ පද හඳුනා ගැනීම.**

**ඉගෙනුම් සම්පත් -**

- **සමානාර්ථ පද ලියූ පත්‍රිකා**
- **පුංචි තිසර ඡේදය සහිත පත්‍රිකා**
- **රූපකාඩ්**
- **චිත්‍ර**

**ඉගෙනුම් ඉගෙනීම් ක්‍රමවේදය - කණ්ඩායම්/ කේවල**

**හඳුනාගැනීමේ ක්‍රියාකාරකම්**

**පියවර 01**

**- ගසක හා තරුවල රූප සාදා අත් රූකඩ ලෙස යොදාගෙන පහත කවිය කියමින් ප්‍රවේශ වීම.**

**ගසට රුකක් කියනවා**
**තරු තාරකා කියනවා**
**එකම වචන තියෙනවා**
**සමානාර්ථ පද කියනවා**

පියවර 02 - කතන්දරයක් මගින්

අත්තම්මා <u>උදෑසනම</u> අවදි වුණා ඒ <u>හිමිදිරිය</u> ම පිරිසිදු වෙලා සිල් ගන්න යන්න සූදානම් වුණා. අත්තම්මා බණ <u>පොත</u> බෑගයට දාගත්තා. ඒ වටිනා <u>ග්‍රන්ථයක්</u>. මල් කඩන්න ගියපු අත්තම්මා ළඟින් ගසක හිටිය <u>කුරුල්ලා</u> පියඹා ගියා. ඒ <u>පක්ෂයා</u> හරිම ලස්සනයි. එකපාරටම අත්තම්මා <u>කකුල</u> අල්ලන් බිම ඉඳගත්තා. ඒ <u>පාදය</u> තුවාල වෙලා. පුංචි සිරිමල් ඇවිත් ඇවිත් අත්තම්මව ගෙදර එක්කරගෙන ගියා.
යන කතන්දර ඉදිරිපත් කරමින් සමානාර්ථ පද හඳුන්වා දීම.

පියවර 03 -
හුණු පුවරුවේ රූපයක් ප්‍රදර්ශනය කරමින් උදෑසන/ කකුල/ වතුර/ කුරුල්ලා/ පොත යන වචන පවසමින් එම වචනවලට අදාල රූපය සහිත ස්ථානයෙන් හිමිදිරිය/ පාදය/ ජලය/ පක්ෂියා/ ග්‍රන්ථය යන වචන කාඩ්පත් රඳවමින්

| | | |
|---|---|---|
| උදෑසන | - | හිමිදිරිය |
| පාදය | - | කකුල |
| කුරුල්ලා | - | පක්ෂයා |
| වතුර | - | ජලය |
| පොත | - | ග්‍රන්ථ |

යන වචන කාඩ් පත් හුනුපවරුවේ රඳවමින් සමානාර්ථ පද හඳුන්වාදීම.

භාවිත ක්‍රියාකාරකම්

පියවර 01
පෙට්ටියක දමන ලද වචනය ගෙන කණ්ඩායම් අතර ප්‍රදර්ශනය කර එයට ගැළපෙන සමානාර්ථ පදය කණ්ඩායම් එක්ව ශබ්ද නගා කියවීමට සැලැස්වීම

| | |
|---|---|
| උදෑසන | ජලය |
| පාදය | පක්ෂයා |
| කුරුල්ලා | හිමිදිරිය |
| වතුර | ග්‍රන්ථය |
| පොත | කකුල |

පියවර 02
කට්ට පුවරුවක දෙන ලද පද යොදාගෙන සමානාර්ථ පද ගොඩනැගීම හා ඩිමයි කොළයේ දෙනලද හිස්තැනට අදාළ සමානාර්ථ පදය කණ්ඩායම් එක්ව ලිවිමට සලස්වා ප්‍රදර්ශනය කිරීම

1. ඒ <u>උදෑසන</u> ඉතා ලස්සනයි
   ඒ ..................... ඉතා ලස්සනයි

2. මම උදෑසන <u>වතුර</u> වීදුරුවක් පානය කරමි.
   මම උදෑසන ..................... වීදුරුවක් පානය කරමි.

3. අපි <u>පාදය</u> ඉහලට ඔසවමු,
   අපි ...................... ඉහලට ඔසවමු,

4. සුනිල් <u>පොත</u> රාක්කයෙන් තබයි
   සුනිල් ...................... රාක්කයෙන් තබයි

5. <u>කුරුල්ලා</u> අහසේ වේගයෙන් පියාඹයි
   ...................... අහසේ වේගයෙන් පියාඹයි

ඇගයීම හා තක්සේරුව

පියවර 1
දෙන ලද වචනයට ගැළපෙන සමානාර්ථ පදය තෝරා ගැනීම හා කියවීමට සැලැස්වීම

පියවර 2
දෙන ලද පදවලට අදාල සමානාර්ථ පදය ලිවීම.

උදෑසන -
කකුල -
වතුර -
කුරුල්ලා -
පොත -

පියවර 3
දෙන ලද වැකියේ ඉරි ඇඳි පදයට අදාළ සමානාර්ථ පදය යොදා එම වැකිය නැවත ලිවීමට දීම.

<u>උදෑසන</u> ට අපේ ඇඟට සීතලක් දැනෙයි.
.........................................................................

අඹ අත්තේ සිටින <u>කුරුල්ලා</u> හරිම ලස්සනයි.
.........................................................................

ගංගාවලින් අපට <u>ජලය</u> ලැබේ.
.........................................................................

<u>කුරුල්ලා</u> උදෑසනම නාද කරමින් ගුවනේ ඉගිලෙයි.
.........................................................................

මගේ පාදය <u>තුවාල</u> විය.
.........................................................................

**ඉඳිරි පෝෂණය** හා **ප්‍රතිකාරය**

**තනිව ඉගෙන ගන්නා සිසුන්**

A. **ක්‍රීඩාවක් ඇසුරුන් - දාදු කැටයේ පැති 6ට වචන ලියා ලබා දී දාදු කැටය උඩ දැම්මෙන් පසුව ලැබෙන වචනයට ගැළපෙන සමානාර්ථ පදය ලිවීම.**

යහළුවන් ගෙන් **ඉගෙන ගන්නා සිසුන්**

B. **දෙන ලද සමානාර්ථ පද සහිත වචන යොදා වචන පිළිවෙළින් තබා වැකි නිර්මාණය**

**උදාහරණ -**

1. **කුරුල්ලෝ අහසේ පියාඹති.**
   **අහසේ /පියාඹති /පක්ෂියා**

2. **ඒ පොත තුන්වන රාක්කයේ ඇත.**
   **තුන්වන/ ඒ /රාක්කයේ /ඇත /ග්‍රන්ථය**

3. **මම වේගයෙන් පාදය සොලවමි.**
   **වේගයෙන් /මම /සොලවෙමි /කකුල**

4. **අපට ජලය අත්‍යවශ්‍ය වේ.**
   **වතුර/ අත්‍යවශ්‍ය/ වේ/ අපට**

5. **ඒ හිමිදිරිය ඉතාම පියකරුය.**
   **උදෑසන/ ඒ /පියකරු ය/ ඉතා ම**

**ගුරුවරයාගේ මඟ සහයෙන් ඉගෙන ගන්නා සිසුන්**

C. **පහත පැවරුම් පතේ සමානාර්ථ පද කාඩ්පත් තැබීමට අවස්ථාව දීම.**

| | | |
|---|---|---|
| **හිමිදිරිය** | ................................ | |
| ................................ | **කකුල** | |
| **පොත** | ................................ | |
| **වතුර** | ................................ | |
| ................................ | **පක්ෂියා** | |

| | |
|---|---|
| **උදෑසන** | **පාදය** |
| **ජලය** | |
| **කුරුල්ලා** | **ග්‍රන්ථය** |

**ගුරුවරයාගේ පූර්ණ සහය ඇතිව ඉගෙන ගන්නා සිසුන්**

D. **රූප කාඩ්පත් ඉදිරියෙන් සමානාර්ථ පද සැකසීම.**

**උදාහරණ -**  **පක්ෂියා - කුරුල්ලා**

**සාරාංශය -**

**සමානාර්ථ පද යනු මොනවාදැයි යන්න නැවත සාකච්ඡා කර අද දින ඉගෙනගත් සමානාර්ථ පද නැවත ආවර්ජනය කිරීම**

**දිනය** - පලමු වාරය 5 සතිය 5 දවස

**ශ්‍රේණිය - 4**

**විෂය - ගණිතය**

**කාලය - මිනිත්තු 60**

**ඒකකය - සංඛ්‍යා රටා**

**නිපුණතාවය -**

- **සංඛ්‍යා රටා ගොඩනගයි**

**ඉගෙනුම් පල - පොදු අන්තරය 2, 5 සහ 10 වූ සංඛ්‍යා රටා ගොඩනගයි**

- **පොදු අන්තරය 2 වන සංඛ්‍යා රටා කියවයි**
- **පොදු අන්තරය 2 වන සංඛ්‍යා රටා ද්‍රව්‍ය ඇසුරෙන් ගොඩනගයි**

**පාඩම - පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටා ගොඩනැගීම**

**ඉගෙනුම් සම්පත් - කෝච්චි පෙට්ටිවල ආකෘති/ කඩදාසි මල්/ රූකඩ/ සංඛ්‍යා කාඩ්පත්/ ගණක/ පැවරුම් පත්**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය - කේවල සහ කණ්ඩායම්**

**මනෝමය ගණිතය -**

- **මල්ලක ඉදුනු අඹ 12ක් ද අමු අඹ 10ක් ද ඇත. මල්ලේ ඇති මුළු අඹ ගණනින් කීයද?**
- **විසිපහට පෙර සංඛ්‍යාව සහ පසු සංඛ්‍යාව පවසන්න.**

**හඳුන්වාදීම -**

**පියවර 1 - ආකෘතියක් මගින්**

**දුම්රිය නිවේදනයක් ඉදිරිපත් කිරීම**

**(හූ............) සවන් දෙන්න ගම්පොළ සිට නාවලපිටිය බලා ගමන් කරන උඩරට මැණිකේ දුම්රිය තව ස්වල්ප මොහොතකින් වේදිකාවට පැමිණෙනු ඇත. මගීන් සූදානම්ව සිටින්න.**

**සිසුන් එළිමහනට රැගෙන ගොස් මේසයක් මත කෝච්චි පෙට්ටියක් ආකෘතියක් ප්‍රදර්ශනය කර කතන්දරයක් පැවසීම. මුහුණු සහිත රූකඩ රැඳවීම. ( නාවලපිටිය යන දුම්රිය දැන් මෙතන නවත්තලා තියෙනවා මේ යාළුවො ටික දුම්රියට නගින්න හදන්නේ.) මං දැන් එයාලාව කෝච්චි පෙට්ටිවලට නග්ගනවා බලමු අපි එයාලට කොහොමද දැන් වාඩිවෙලා ඉන්නේ කියලා**

**පළමු පෙට්ටියේ දෙන්නයි**
**දෙවැනි පෙට්ටිය හතර දෙනයි**
**තුන්වෙනි පෙට්ටියේ හය දෙනයි**

මේ ආකාරයට කෝච්චි පෙට්ටිවල සිටින රූකඩ යාළුවන් ගණන ගණන් කිරීම. එම සංඛ්‍යා ධාර කෝච්චි පෙට්ටිවල රැඳවීම. එමගින් බඳුන් අන්තරය දෙක වූ සංඛ්‍යා රටා හඳුන්වාදීම

පියවර 2 - මලක පෙති ඇසුරින්

පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටා හඳුන්වාදීම.

පියවර 3 - ආදර්ශනයක් මගින්

පොදු අන්තරය 2ක් වූ සංඛ්‍යා රටා කීපයක් ලියා පත්‍රිකාවක් ප්‍රදර්ශනය කර දී ඇති මුල් සංඛ්‍යාවට අනුව සංඛ්‍යා රටාව ගොඩනැගීම ආදර්ශනය කිරීම.

1 ................., ................., .................,

2 ................., ................., .................,

3 ................., ................., .................,

7 ................., ................., .................,

භාවිත ක්‍රියාකාරකම්

පියවර 1 - සිසුන් කණ්ඩායම්වලට වෙන් කර ගණක ලබා දී ගුරුවරයා පවසන සංඛ්‍යාවේ සිට ඉදිරියට පොදු අන්තරය 2 වන රටා ගොඩනැගීම සහ ඊට අදාළ සංඛ්‍යාපත් තැබීම.

පියවර 2 - ලබා දෙන පැවරුම්පත් ඇති සංඛ්‍යාවෙන් පටන් ගෙන රූප මගින් රටාව ගොඩනැගීම

| | | | |
|---|---|---|---|
| 2 | ●● | ●●● | ●●●<br>●●● |
| 3 | | | |
| 6 | | | |
| 7 | | | |

පියවර 3 - සංඛ්‍යා කාඩ්පත් මේසය මත මුනින් අතට හරවා තබා එක් සිසුවෙක් කැමති කාඩ්පතක් ගෙන එහි සඳහන් සංඛ්‍යාවෙන් පටන් ගෙන පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටා ගොඩනැගීම. (සියලු සිසුන් සහභාගී විය යුතුය)

ඇගයීම හා තක්සේරුව

පියවර 1 - දෙනලද රූප කට්ටලය දෙකේ රටාවක් අනුව සකස් කිරීම

පියවර 2 - සංඛ්‍යාපත් භාවිත කර තමන් කැමති පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටාවක් ගොඩනැගීම

පියවර 3 - ලබාදෙන සංඛ්‍යා රටා වල හිස්තැන් පිරවීම.

**ඉදිරිපෝෂණය** හා **ප්‍රතිකාර්ය -**

**තනිව ඉගෙන ගන්නා සිසුන්**

A **කණ්ඩායම - තමන් කැමති පොදු අන්තරය දෙක වූ සංඛ්‍යා රටා තුනක් ගොඩනැගීම.**

යහළුවන් සමග **ඉගෙන ගන්නා සිසුන්**

B **කණ්ඩායම - මිතුරා සමග එක්ව සංඛ්‍යා රටා 3ක් ගොඩනැගීම.**

**ගුරුවරයාගේ** සහය මදක් අවශ්‍ය කණ්ඩායම

C **කණ්ඩායම - ගණක භාවිත කර ගුරුවරයා පවසන සංඛ්‍යාවෙන් පටන්ගෙන රටාව ගොඩනැගීම.**

**ගුරුවරයාගේ පූර්ණ සහය ඇතිව ඉගෙන ගන්නා සිසුන්**

D **කණ්ඩායම - සංඛ්‍යා රටාවේ මුල් පදය 10ට අඩුවන සංඛ්‍යාවක් ගෙන ගණක භාවිත කර සංඛ්‍යා රටා ගොඩනැගීම.**

**සාරාංශය - පොදු අන්තරය 2 වූ රටා ගොඩනගයි**

- **දිනය** -: තුන්වන වාරය 8 සතිය 1 දවස
- **විෂය** -: ගණිතය
- **ශ්‍රේණිය** -: 4 ශ්‍රේණිය
- **පාඩම** -: රෝම සංඛ්‍යාංක
- **නිපුණතාව** -: **i සිට x තෙක් රෝම සංඛ්‍යාංක හඳුනාගෙන භාවිත කරයි.**
- **ඉගෙනුම් පල** -:

1) 1 සිට 5 තෙක් හින්දු අරාබි සංඛ්‍යාංක හඳුනාගෙන ප්‍රකාශ කරයි.
2) i සිට v තෙක් රෝම සංඛ්‍යාංක කියවයි.
3) i සිට v තෙක් රෝම සංඛ්‍යාංක ලියයි.
4) i සිට v තෙක් හින්දු අරාබි සංඛ්‍යාංකවලට යෙදෙන රෝමසංඛ්‍යාංක ගළපයි.
5) i සිට v තෙක් රෝම සංඛ්‍යාංක හඳුනාගෙන භාවිත කරයි.

- **ඉගෙනුම් සම්පත්** -: රෝම හා හින්දු සංඛ්‍යා පත්/ තරමක් විශාල කූඹි පස්දෙනෙකුගේ රූප/බිම්මලක රූප හා එහි තැබීමට හැකි වන සේ සකස් කර ගත් වෘත්ත/ පැවරුම් පත්

- **කාලය** -: මිනිත්තු 60
- **ප්‍රවේශය** -: කතන්දරයක් ආකාරයට පහත විස්තරය සිසුන්ට රසවත් ආකාරයෙන් ඉදිරිපත් කිරීම.

"ඔන්න දවසක් කූඹි ගමේ ලොකු සද්දයක්. මාත් පොඩ්ඩක් එබිකන් කරලා බැලුවා. කූඹි පෙළපාළියක් යන්න වගේ. කූඹි පස්දෙනෙක් අතේ බෝඩ් වගයකුත් තිබුණා. මෙයාලා කූඹි රජතුමාගේ සීනි කැට ඉල්ලන්න පෙළපාළියක් යන්නයි මේ සූදානම. මේ බලන්නකෝ කූඹි අතේ තියෙන බෝඩ් මොනාද කියලා.

පළවෙනි කූඹියා කෑගහනවා මට ඕනෑ 1ක්







දෙවෙනි කූඹියා කෑගහනවා මට ඕනෑ 2ක්
මේ ආකාරයට කූඹින් පස්දෙනා ම ප්‍රදර්ශනය කිරීම.

- **හඳුන්වාදීමේ ක්‍රියාකාරකම්** -:

4) මෙම සංකේත දැක තිබේදැයි සිසුන්ගෙන් විමසීම.
5) ගණිතය පෙළ පොත රැගෙන එහි මුල් පිටුවේ සිට පිටු අංක ලියා ඇති ආකාරය නිරීක්ෂණය කිරීමට යොමු කිරීම.
6) එම සංකේත ගුරුවරයා කළුලෑල්ලේ අනුපිළිවෙළින් ලිවීම. පිටු අංක විමසමින් හින්දු අරාබි සංඛ්‍යා ඊට ඉදිරියෙන් ලිවීම.
7) සංඛ්‍යා වර්ග දෙක රෝම හා හින්දු ලෙස හඳුන්වාදීම. මෙම සංඛ්‍යා වර්ග දෙක ම භාවිතා කරන අවස්ථා හා භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරදීම.
8) ලියූ සංඛ්‍යා වර්ග දෙකම සිසුන් සමඟ කියවීම.
9) රෝම සංඛ්‍යාංක ලියන ආකාරය කළුලෑල්ලේ ලියමින් පැහැදිලි කරදීම.

➲ **භාවිත ක්‍රියාකාරකම් -:**


4) සිසුන් කණ්ඩායම් කර පහත දක්වා ඇති පරිදි සකස් කරගත් කාඩ්පත් හා ඉරටු/ ගිනිකූරු ලබාදී ඒවා යොදාගනිමින් රෝම සංඛ්‍යාංකය සෑදීමට යොමු කිරීම.

| | | |
|---|---|---|
| 1 | i | |
| 2 | ii | |
| 3 | iii | |
| 4 | iv | |
| 5 | v | |

5) කණ්ඩායම් සඳහා පහත පරිදි බිම්මලක රූප සටහනක්, බිම්මලේ තැබිය හැකි පරිදි සකස් කරගත් රවුම්/හින්දු අරාබි හා රෝම සංඛ්‍යාංක සහිත කාඩ්පත් කට්ටලයක් ලබාදීම.


- තම කණ්ඩායමට ලැබුණු බිම්මලේ එක් අයෙක් කැමති රවුම් ප්‍රමාණයක් තැබීම එයට අදාළ රෝම හා හින්දු සංඛ්‍යා තැබීමට යොමු කිරීම
- කණ්ඩායම් අතර කාඩ්පත් හා බිම්මලේ රූප සටහන මාරු කරගනිමින් ක්‍රියාකාරකමේ යෙදීමට යොමු කිරීම.


| | | | |
|---|---|---|---|
| 1 | 4 | ii | v |
| 2 | 5 | iii | |
| 3 | i | iv | |





6) සිසුන් එළිමහනට රැගෙන යාම. රෝම සංඛ්‍යාංක සහිත කොඩි එළිමහනේ විවිධ ස්ථානවල රැඳවීම. ගුරුවරයා පවසන අංකයට අදාළ කොඩිය තිබෙන ස්ථානයට දිවීමේ ක්‍රීඩාවේ යෙදීමට යොමුකිරීම.


7) කණ්ඩායම් සඳහා සංඛ්‍යාව සටහන් කරන ලද රූප සටහන් ලබාදීම. ඒවා අධ්‍යයනය කරමින් තම අභ්‍යාස පොතේ ඒවා සටහන් කරගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදීම.











➲ **තක්සේරු ක්‍රියාකාරකම් -:**

1) සංඛ්‍යාපත් / ද්‍රව්‍ය ලබා දී ගුරුවරයා පවසන ඉලක්කමට අදාළ ද්‍රව්‍ය හා සංඛ්‍යාපත තැබීමට යොමු කිරීම.
2) රෝම සංඛ්‍යා අනුපිළිවෙළින් ලිවීමට යොමු කිරීම.

➲ **ප්‍රතිකාර්ය හා ඉදිරිපෝෂණ ක්‍රියාකාරකම්**

**A කණ්ඩායම -:** ක්‍රීඩාවක් ආකාරයට පහත පරිදි සටහනක් සකස්කර පිරවීමට ලබා දීම. කණ්ඩායමේ සිටින සිසුන්ගෙන් එක් අයෙක් අන් අයට නොපෙනෙන සේ රෝම සංඛ්‍යාවක් ලිවීම. එම ලියූ සංඛ්‍යාව කණ්ඩායමේ මිතුරන් අනුමාන කොට පැවසිය යුතු බව දැන්වීම. ඔවුන්ගේ අනුමානය නිවැරදි වුවහොත් තමන් ළඟ ඇති සංඛ්‍යාපතේ ලියන ලද රෝම සංඛ්‍යාවට අදාළ කොටුවට කතිර ලකුණක් දැමීමට යොමු කිරීම. අනුමානය වැරදුණෝනම් සංඛ්‍යාව ලියූ සිසුවාගේ සංඛ්‍යාපතේ එම සංඛ්‍යාව සළකුණු කරගැනීමට යොමු කිරීම.

| | | | | |
|---|---|---|---|---|
| **i** | **i** | **i** | **i** | **i** |
| **ii** | **ii** | **ii** | **ii** | **ii** |
| **iii** | **iii** | **iii** | **iii** | **iii** |
| **iv** | **iv** | **iv** | **iv** | **iv** |
| **v** | **v** | **v** | **v** | **v** |

**B කණ්ඩායම -:** රෝම සංඛ්‍යා ඇතුළත් කාඩ්කුට්ටමක් හා රූප පත්‍රිකා සකස් කරගැනීම.

එක් සිසුවෙකුට මුනින් හරවා ඇති තමන් සතු රූප කාඩ්පත් වලින් එකක් මේසය මැදට දැමීමට යොමු කිරීම. එම රූපයට අදාළ රෝම සංඛ්‍යා පත මේසයට දැමීමට (ඕමි ක්‍රීඩාව සිදු කරන ආකාරයෙන්) යොමු කිරීම. රූපය දැමීමේ අවස්ථාව මාරු කරමින් ක්‍රීඩාවේ නිරත වීමට යොමු කිරීම.

**C කණ්ඩායම -:** කඩදාසි පිඟන් හා රෙදි කොකු(cloth clips) හෝ කඩදාසි වෘත්ත හා කඩදාසි ඇමිණුම් කටු කණ්ඩායමට ලබාදීම. එම කඩදාසි පිඟන් හෝ වෘත්ත මැද රෝම සංඛ්‍යා ලියා තැබීම. ගුරුවරයා විසින් රූප කාඩ්පතක් මේසය මැද තැබූ විට එම රූපයට අදාළ සංඛ්‍යාව සහිත කඩදාසි වෘත්තය/ පිඟාන තෝරා ගෙන එයට රෙදි කොකු හෝ ඇමිණුම් කටු රැඳවීමට යොමු කිරීම. ඉන්පසු එම සංඛ්‍යාව හින්දු අරාබි ඉලක්කම ඉදිරියෙන් ලිවීමට යොමු කිරීම.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

**D කණ්ඩායම-:** ගුරුවරයා සමඟ එක් වී ද්‍රව්‍ය, රූප, රෝම සංඛ්‍යා සියල්ල ලබා දී ගැළපීමට ලබා දීම.

- **දිනය** -: දෙවන වාරය 8 සතිය 1 දවස
- **විෂය** -: ගණිතය

- **ශ්‍රේණිය** -: 4 ශ්‍රේණිය
- **පාඩම** -: 2න් ගුණ කරමු
- **නිපුණතාව** -: **සංඛ්‍යා ගුණ කිරීමේ ගැටලු විසඳයි.**
- **ඉගෙනුම් පල -: ඉලක්කම් දෙකකට නොවැඩි සංඛ්‍යාවක් දෙකෙන් ගුණ කර පිළිතරු ප්‍රකාශ කරයි**
  - 1 - 20 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් කියවයි.
  - 2හි ගුණන වගුව ගොඩනගා කියවයි.
  - 2හි ගුණන වගුව මතකයෙන් කියවයි.
  - තනි ඉලක්කමෙන් 2න් ගුණ කර පිළිතු ප්‍රකාශ කරයි.
  - ස්ථානීය අගය සලකමින් 2න් ගුණ කර පිළිතුර ප්‍රකාශ කරයි.

- **ඉගෙනුම් සම්පත් -:** හැඩතලවලින් සැකසූ නිර්මාණ, හිඩැස්පත්, $A_4$ කොළ, ගම්, කතුරු

- **කාලය** -: මිනිත්තු 60


- **ප්‍රවේශය** -: පහත ගීතය ගායනා කරමින් පාඩමට පිවිසීම.

**අම්මා ගෙනා මුතු මාලයේ**
**මුතු ඇට විස්සක් තිබුණා**
**නංගි ඒවා එකින් එකට**
**ගණන් කළා උඩ පනිමින්**
**පුංචි මමත් එකතු වෙලා**
**දෙකෙන් දෙකට ගණන් කළා**
**ඔක්කොම මුතු ඇට විස්සයි**
**ඔක්කොම මුතු ඇට විස්සයි.**

- **හඳුන්වාදීමේ ක්‍රියාකාරකම් -:**

10) ඉහත පිවිසීමට යොදාගත් ගීතයේ නංගී මුතු ඇට ගණන් කළ අයුරු කෙසේ ද? යන්න සාකච්ඡා කරමින් මුතු මාලයක් ආකාරයෙන් ඇලවීම. මුතු ඇට හෝ කපා ගත් රවුම් විස්සක් ඇමිණීම හෝ ඇලවීම. එකින් එක මුතු අලවන විට සංඛ්‍යා පතක් තැබීම.

ආදී ලෙස සංඛ්‍යා පත තැබීම




(

11) රූකඩ යොදා ගනිමින් පහත දෙබස ගොඩනැගීම.

විසල් -: අම්මේ, අද ගුරුතුමී ගණන් 10ක් දුන්නා. මගේ ගණන් 10ම හරි.

අම්මා -: මගේ පුතා හරිම හොඳයි. ගුරුතුමී මොකද? කීවේ. මගේ පුතාට.

විසල් -: පන්තියේ වැඩිම ලකුණු මට 20න් 20යි. එක ප්‍රශ්නෙකට ලකුණු
දෙක ගානේ දුන්නා.

අම්මා -: කෝ බලන්න අපි ගණන් කරමු පුතා.

| ප්‍රශ්න අංක | එක් ප්‍රශ්නයකට ලකුණු | ලකුණු |
|---|---|---|
| 1 | 2 | 2 |
| 2 | 2 | 4 |
| 3 | 2 | 6 |
| 4 | 2 | 8 |
| 5 | 2 | 10 |
| 6 | 2 | 12 |
| 7 | 2 | 14 |
| 8 | 2 | 16 |
| 9 | 2 | 18 |
| 10 | 2 | 20 |

අම්මා සහ පුතා මාරුවෙන් මාරුවට කියවීම. 2, 4, 6................ආදි ලෙස 20 තෙක් කියවීම.
ගුරුවරයා මෙය පුවරුවක ගොඩනගමින් කියවන්න. පළවෙනි ප්‍රශ්නයට ලකුණු 2 යි, දෙවන ප්‍රශ්නයට ලකුණු 2යි, ප්‍රශ්න දෙකට ලකුණු 4 යි... ආදී ලෙස කියවීම.

| | |
|---|---|
| 1 x 2 | 2 |
| 2 x 2 | 4 |
| 3 x 2 | 6 |
| 4 x 2 | 8 |
| 5 x 2 | 10 |

12) විසල් පසුදා පාසල් යද්දී යාළුවෝ හතර දෙනා ගීතයක් ගයමින් සිටි බව පන්තියට පැවසීම.

**විසල් එන්න එකතුවෙන්න**
**පස් දෙනාම බෙදා ගන්න**
**මල්ල දිහා බලන්නැතුව**
**ගෙනාව අඹ ගණන් කරමු**
**පස් දෙනාම එකතු වෙලා**
**දෙක ගානේ සමව ගනිමු**
**අඹ මල්ලේ අඹ ඉවරයි**

**ගෙනාව අඹ ගණන කියමු.**
(මේ සඳහා කිනම් හෝ සැබෑ ගෙඩි වර්ගයක නමක් යොදා ඒවා සපයාගන්න. දරුවන් පස් දෙනෙක් ඉදිරියට ගෙන්වා මල්ලෙන් අඹ ගෙන දෙක ගනනේ බෙදා දෙන්න.මල්ලේ ගෙනා අඹ කීයද යන්න විමසමින් පස්දෙනෙකු ගත්විට විසඳීම.

$$\begin{array}{r} 5 \\ \times\ 2 \\ \hline \\ \hline\hline \end{array}$$

13) බෝල හෝ වෙනත් බෙදා දිය හැකි ද්‍රව්‍ය පන්තියේ සිසුන් ප්‍රමාණයට ගෙන බෑගයක දමා දරුවන්ට පෙන්වීම. මෙම මල්ලේ ඇති බෝල පන්තියේ සියලුම දරුවන්ට බෙදා දෙන බව පවසා සිසුන් සිටවා බෙදා දීම. මල්ලේ තිබූ මුළු බෝල ගණන සොයා ගැනීමට අවශ්‍ය බව පවසා. එය සාදා ගැනීමට පහසු ක්‍රමයක් ඇති බව පැවසීම. පහත ආකාරයෙන් ඩිමයි කොළයක ලියමින් පැහැදිලි කිරීම. මෙහි දී ස්ථානීය අගය පිළිබඳව ද පැහැදිලි කර දීම.

දහයස්ථානය ඒකස්ථානය (සිසුන් ප්‍රමාණය අනුව, ගෙනයාමක් රහිත වන සේ)

$$\begin{array}{r} 3\ 2 \\ \times\ \ 2 \\ \hline \\ \hline\hline \end{array}$$

මල්ලේ තිබූ බෝල ගණන

- **භාවිත ක්‍රියාකාරකම් -:**

8) 1 සිට 20 තෙක් සංඛ්‍යා කාඩ්පත් කණ්ඩායම්වලට ලබා දී 1 සිට 20 තෙක් **අනුපිළි**වෙළින් කියවීමට යොමු කිරීම.
ඉහත කාඩ්පත් යොදා ගනිමින් එකක් හැර එකක් ගණන් කරමින් 2,4,6 ලෙස 20 තෙක් ගණන් කිරීමට යොමු කිරීම.

9) කාඩ්පත් ලබාදීම

| 1 x 2 | 2 x 2 | 3 x 2 |
|---|---|---|

දක්වා ඇති පරිදි බන්ධන සංඛ්‍යාපත් කට්ටලයක්

| 2 | 4 | 6 |
|---|---|---|

දක්වා ඇති පරිදි 20 තෙක් කාඩ්පත් 10ක්

මෙම කාඩ්පත් යොදා ගනිමින් 2හි ගුණන වගුව ගොඩ නගා කියවීමට යොමු කිරීම.සිසුන් යුගළ කර පැවරුම්පත් ලබා දී පහත ක්‍රියාකාරකම් කරවීම.

**උදා-:** කුකුළෙකුගේ පාද ගණන 2කි. කුකුළන් 5 දෙනෙකුගේ පාද කීය ද?

10) ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක් 2න් ගුණ කිරීමේ පැවරුම් පත් ලබාදීම. එක් කණ්ඩායමකට එක බැගින්

| (1) | (2) | (3) |
|---|---|---|
| 24 | 32 | 14 |
| x 2 | x 2 | x 2 |
| ______ | ______ | ______ |

**තක්සේරු ක්‍රියාකාරකම් -:**

**1)** රූප ගණන් කර සංඛ්‍යාව හා සංඛ්‍යා නාමය ලිවීමේ අභ්‍යාස ලබාදීම.

**උදා-:** **සංඛ්‍යාව** **සංඛ්‍යා නාමය**



..........................  ..........................



..........................  ..........................

**2)** හිස් තැන් පිරවීමේ අභ්‍යාස ලබා දීම (පහත ආකාරයට සකස් කර ගන්නා ලද පැවරුම්පත්)

| | | |
|---|---|---|
| **2 x......** | = | **10** |
| **......x 3** | = | **06** |
| **5 x 2** | = | **................** |

**3)** පහත පැවරුම්පත විශාල ප්‍රමාණයේ කඩදාසියක ලියා පුවරුවක ඇලවීම, තනි තනිව පිළිතුරු ලිවීමට ලබා දීම හෝ සිදු කිරීම.

| | | | |
|---|---|---|---|
| 7 | 9 | 23 | 30 |
| x 2 | x 2 | x 2 | x 2 |
| ______ | ______ | ______ | ______ |

- **ප්‍රතිකාර්ය හා ඉදිරිපෝෂණ ක්‍රියාකාරකම්**

**A කණ්ඩායම -:** පන්තියක සිටින සිසුන් 34 දෙනෙකුට එක් අයෙකුට 2 බැගින් පැන්සල් දෙන ලදි. දෙන ලද මුළු පැන්සල් ගණන කීය ද? (ගෙනයාම් රහිත මෙවැනි පැවරුම්පත් පහක් ලබා දීම)

**B කණ්ඩායම -:** කාඩ්පත් මඟින් 2 ගුණන වගුව ගොඩනැගීම, (යුගල ලෙස හා මතකයෙන්
කියවීමට ලබා දීම)

**C කණ්ඩායම -:** 1 සිට 20 තෙක් කාඩ්පත් කවලම් කර පෙට්ටියකට දමා 1 සිට 20 තෙක්
සංඛ්‍යා කියවීමට දීම හා 2න් 2ට සංඛ්‍යා කියවීමට සහය දීම.**D කණ්ඩායම-:** දරුවා ගුරුවරයා ළඟට ගෙන සැබෑ ද්‍රව්‍ය සපයා 1 සිට 20 තෙක් ගණන්
කිරීමට ලබා දීම